# 107 වන අධිකාරය

# නොතාරිස්වරු

නොතාරිස්වරුන්ට අදාළ නීතිය සංශෝධනය කිරීම සඳහා ද නොතාරිස්වරුන්ගේ නියම සුදුසුකම පිළිබඳව සහ නොතාරිස් කෙනකුගේ ධුරයට අයත් යුතුකම් වඩාත් කාර්යක්ෂමව හා විශ්වාසදයක ලෙස ඉටුකරනු ලැබීම පිණිස වැඩිදුරටත් විධිවිධාන සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ නීතිය ඒකාබද්ධ කිරීම සඳහා ද වූ ආඥපනතකි.

## 107 වන අධිකාරය

## නොතාරිස්වරු

නොතාරිස්වරුන්ට අදාළ නීතිය සංශෝධනය කිරීම සඳහා ද
නොතාරිස්වරුන්ගේ නියම සුදුසුකම පිළිබඳව සහ
නොතාරිස් කෙනෙකුගේ ධුරයට අයත් යුතුකම්
වඩාත් කාර්යක්ෂම ව හා විශ්වාසදායක ලෙස
ඉටු කරනු ලැබීම පිණිස වැඩිදුරටත්
විධිවිධාන සැලැස්වීම සඳහා ද
ඊට සම්බන්ධ නීතිය ඒකාබද්ධ
කිරීම සඳහා ද වූ ආඥාපනතකි.

(1907 මාර්තු 27)

ආඥාපනත් අංක—
1907 අංක 1
1909 අංක 27
1910 අංක 18
1917 අංක 31
1919 අංක 22
1927 අංක 24
1934 අංක 10
1936 අංක 10
1943 අංක 7
1943 අංක 59
1944 අංක 51
1947 අංක 48

පනත අංක—
1951 අංක 6

1. මේ ආඥාපනත නොතාරිස් ආඥාපනත යනුවෙන් සියලු කාර්යයන් සඳහා හඳුන්වනු ලැබිය හැකි ය.

*ලුහුඬු නාමය.*

2. නොතාරිස් ධුරයකට කරනු ලබන සෑම පත් කිරීමක් ම ඇමතිවරයා විසින් දෙනු ලබන බලපත්‍රයක් මගින් කළ යුතු අතර, පත් කරනු ලබන තැනැත්තාට වෘත්තියෙහි යෙදීමට බලය පවරනු ලබන ප්‍රදේශය ද භාෂාව හෝ භාෂා ද එහි නිශ්චිත ව සඳහන් විය යුතු ය.

*ඇමතිවරයාගේ බලපත්‍රයෙන් නොතාරිස් පත් කිරීම.*

3. නීතිඥයකු වශයෙන් ඇතුළත් කර ගනු ලැබීමට පෙර වුව ද පසුව වුව ද ඔප්පු ලිවීම පිළිබඳ නියමිත පරීක්ෂණයෙන් සමත් වී සිටින්නා වූ හෝ එක්සත් රාජධානියෙහි හෝ අන් රටක නීතිය පිළිබඳ සුදුසුකමක් ලබා තිබීමේ හේතුවෙන් එවැනි නීතිඥයකු ලෙස ඇතුළත් කර ගනු ලැබ සිටින්නා වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ සෑම නීතිඥයකු ම, ඔහු ඉල්ලුම් කළ විට, තමා පදිංචි ව සිටින අධිකරණ කොට්ඨාශය තුළ නොතාරිස් කෙනකු වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් වෘත්තියෙහි යෙදීමට බලය දෙන බලපත්‍රයක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

*ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් නොතාරිස්වරුන් වශයෙන් ඇතුළත් කර ගැනීමට සුදුසුකම්. (§3, 1947 අංක 48)*

4. (1) ඇමතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයන් නොවන තැනැත්තන් නොතාරිස්වරුන් වශයෙන් පත් කළ හැකි ය :

එසේ වුව ද ඒ තැනැත්තන්—

(අ) යහපත් චරිතයක් සහ හොඳ නමක් ඇති ව සිටිය යුතු ය ;

(ආ) අවුරුදු විසි එකේ පූර්ණ වයසේ සිටිය යුතු ය ;

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකුගේ, මෙහි මින් මතු විධිවිධාන සැලැස්වෙන පරිදි බලය ලත් ප්‍රතිඥත ආධුනිකයකු ව සිට අවුරුදු තුනක් එසේ නිසි ලෙස සේවය කර තිබිය යුතු ය ; තවද

*නොතාරිස්වරුන් ලෙස පත් කරනු ලැබීමට වෙනත් තැනැත්තන්ට තිබිය යුතු සුදුසුකම්.*



1—ජේ 7440—3,506 (71/9)

(ආ) ඇමතිවරයා විසින් නියම කරන ලද පරීක්ෂණයකින් සමර්ථ වී සිටිය යුතු අතර යථා පරිදි සුදුසුකම් ලබා සිටින බව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් වාර්තා කරනු ලැබ සිටිය යුතු ය.

(§2, 1951 අංක 6)

(2) ඇමතිවරයා විසින් නියම කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයක* හෝ එදිනට පසු (I) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ සෑම නොතාරිස් කෙනකු ඔහු පදිංචි ව සිටින අධිකරණ කොට්ඨාශය ඇතුළත වෘත්තියෙහි යෙදීමට හිමිකම් ලැබිය යුතු ය.

එක් භාෂාවකින් වෘත්තියෙහි යෙදීමට බලය ලත් නොතාරිස් කෙනකුට වෙනත් භාෂාවකින් වෘත්තියෙහි යෙදිය හැකි වීමට පෙර ඉටුකළ යුතු කොන්දේසිය.
(§3, 1947 අංක48)

5. යම් එක් භාෂාවකින් වෘත්තියෙහි යෙදීමට බලපත්‍රයකින් බලය ලැබූ නොතාරිස් කෙනකුට, වෙනත් යම් භාෂාවක් සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරීක්ෂණයකින් සමර්ථ වීමෙන් පසු ඒ අනික් භාෂාවෙන් වෘත්තියෙහි යෙදීමට බලය පැවරෙන බලපත්‍රයක් ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

ප්‍රතිඥත ආධුනිකයන්ගේ ගණන තීරණය කළ යුතු ආකාරය.
(§4, 1947 අංක 48)

6. එක් එක් දිස්ත්‍රික්කය සඳහා සහ තුළ බලපත්‍ර දිය යුතු ප්‍රතිඥත ආධුනිකයන්ගේ ගණන ඇමතිවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන ආඥාවක් මගින් සීමා කර නිශ්චය කළ යුතු ය.

ප්‍රතිඥත ආධුනිකයන් සහ නොතාරිස්වරුන් ඇතුළත් කර ගැනීම.

7. ප්‍රතිඥත ආධුනිකයන් වශයෙන් හා නොතාරිස්වරුන් වශයෙන් පුද්ගලයන් ඇතුළත් කරගැනීම පළමුවන උප ලේඛනයේ නියෝග වලට යටත් විය යුතු අතර, 8 වන වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් අවලංගු කරන තුරු හෝ සංශෝධනය කරන තුරු හෝ වෙනස් කරන තුරු ඒ නියෝග වලංගු විය යුතු ය.

ප්‍රතිඥත ආධුනිකයන් සහ නොතාරිස්වරුන් ඇතුළත් කිරීම සඳහා ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි බව.

8. ඇමතිවරයා විසින් කලින් කල ඒ නියෝග අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම, හෝ අලුත් නියෝග පැනවීම කළ හැකිය. එසේ පනවනු ලබන සියලු නියෝග සහ යම් නියෝගයක් අවලංගු කිරීම, සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම ද ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

තමාගේ බල ප්‍රදේශය ඇතුළත කාර්යාලය තබා ගැනීමට නොතාරිස් බැඳී සිටින බව.

9. බලපත්‍රයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශය ඇතුළත තම කාර්යාලය තබා ගැනීමට සෑම නොතාරිස් කෙනකු බැඳී සිටිය යුතු අතර, මේ විධිවිධානය උල්ලංඝනය කරන යම් නොතාරිස් කෙනකු ඇමතිවරයා විසින් සිය බලපත්‍රය අස් කර ගනු ලැබීමට යටත් විය යුතු ය.

නොතාරිස්ගේ කාර්යාල ගණන සහ ඒවායේ පිහිටීම.
(§2, 1943 අංක 7)

10. (I) කිසිම නොතාරිස් කෙනකු කාර්යාල දෙකකට වැඩි ගණනක් තබා නො ගත යුතු ය.

(2) (අ) නීතිඥයකු වූ කිසිම නොතාරිස් කෙනකු විසින් නොතාරිස් කෙනකු වශයෙන් වූ තම වෘත්තීය කාර්යයන් සඳහා—

(§3, 1951 අංක 6)

(I) තමාගේ වාසස්ථානය, හෝ

* 1951 අප්‍රේල් 27 වෙනි දින අංක 10,240 දරන ගැසට් පත්‍රයෙහි නිවේදනය කිරීමෙන් 1951 මැයි 1 වන දිනය නියම කරන ලදී.

(II) නීතිඥයකු වශයෙන් වූ තම වෘත්තියේ කාර්‍යයන් සඳහා තමා විසින් පවත්වා ගෙන යන හා පාවිච්චි කරනු ලබන කාර්‍යාලයක් නොවන කිසිම ස්ථානයක කාර්‍යාලයක් තබා නො ගත යුතු ය.

(ආ) නීතිඥයකු වූ යම් නොතාරිස් කෙනකුට නොතාරිස් කෙනකු වශයෙන් වූ සිය වෘත්තියේ කාර්‍යයන් සඳහා කාර්‍යාල දෙකක් තිබෙන අවස්ථාවක ඒ කාර්‍යාල වලින් එකක් ඔහුගේ වාසස්ථානයෙහි විය යුතු ය.

එසේ වුව ද, ඒ සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්සන යටතේ වූ ලියවිල්ලකින් බලය පවරනු ලැබුවහොත් එවැනි යම් නොතාරිස් කෙනකු විසින් ඒ කාර්‍යාල දෙක ම මේ උපවගන්තියේ (අ) (II) ඡේදයෙහි විස්තර කරන ලද ස්ථානවල තබා ගත හැකි ය.

11. (1) (අ) නොතාරිස් කෙනකු පදිංචි ව සිටින අධිකරණ කොට්ඨාශයේ කොටසක් තුළ වෘත්තියෙහි යෙදීමට බලය පැවරෙන බලපත්‍රයක් ලබා සිටින නොතාරිස් කෙනකුට ඒ බලපත්‍රය වෙනුවට එම කොට්ඨාශය මුළුල්ලෙහි ම වෘත්තියෙහි යෙදීමට බලය පැවරෙන අලුත් බලපත්‍රයක් දීම ද ;

නොතාරිස් කෙනකුට වෘත්තියෙහි යෙදීමට බලය පවරන ලද ප්‍රදේශය වෙනස් කිරීමට ඇමතිවරයාට ඇති බලය.
(§4, 1951 අංක 6)

(ආ) අධිකරණ කොට්ඨාශයක් මුළුල්ලෙහි ම හෝ ඉන් කොටසක වෘත්තියෙහි යෙදීමට බලය පැවරෙන බලපත්‍රයක් ලබා සිටින නොතාරිස් කෙනකුට ඒ බලපත්‍රය වෙනුවට වෙනත් අධිකරණ කොට්ඨාශයක් මුළුල්ලෙහි ම වෘත්තියෙහි යෙදීමට බලය පැවරෙන අලුත් බලපත්‍රයක් දීම ද ;

ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට ඇමතිවරයා විසින් කළ හැකි ය.

(2) මේ වගන්තියෙහි (1) (අ) වන උපවගන්තිය යටතේ දෙනු ලබන යම් අලුත් බලපත්‍රයක් සම්බන්ධයෙන්, මුද්දර ආඥාපනත යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුව අය නො කළ යුතු ය.

12. (1) නොතාරිස් කෙනකු ලෙස වෘත්තියෙහි යෙදීමට බලපත්‍රයක් දෙනු ලැබූ සෑම තැනැත්තකු විසින්, ඔහු වෘත්තියෙහි යෙදීම ආරම්භ කිරීමට පෙර—

නොතාරිස් විසින් ප්‍රකාශයක් කළ යුතු බව සහ ඇප තැබිය යුතු බව.
(§2, 1944 අංක 51)

(අ) බලපත්‍රයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන දිස්ත්‍රික් විනිශ්චයකරු ඉදිරිපිට දෙවන උපලේඛනයෙහි දැක්වෙන "අ" ආකෘතියෙහි ප්‍රකාශයක් කර අත්සන් කළ යුතු ය ;

(§5, 1951 අංක 6)

(ආ) නොතාරිස් කෙනකු වශයෙන් වූ තම යුතුකම් නිසි ලෙස සහ විශ්වාසදායක ලෙස ඉටු කිරීමේ කොන්දේසියෙන් යුතු රුපියල් දෙදහසක මුදලක බැඳුම්කරයක් මහා රාජිනියට ද එතුමියගේ උරුමක්කරුවන් සහ අනුප්‍රාප්තිකයන්ට ද ලියා අත්සන් කර දිය යුතු ය ; එම මුදල නිශ්චල දේපළ යටත් කොට බැඳ තැබීමෙන් හෝ චංචල දේපළ තැන්පත් කිරීමෙන් (ඒ නිශ්චල හෝ චංචල දේපළ තමා හෝ වෙනත් තැනැත්තකු සතු දේපළ විය යුතු ය.) හෝ පිළිගත් ඇපකාර සමාගමක ඇප සහතිකයෙන් සුරක්ෂිත කළ යුතු ය ; තව ද

(ඇ) තමාගේ බලපත්‍රයෙහි සහතික දූරු පිටපතක් එම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් උසාවියෙහි තැන්පත් කළ යුතුය ;

(§5, 1951 අංක 6)

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් සෑම බැඳුම්කරයක් නොතාරිස්ගේ බලපත්‍රයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන දිස්ත්‍රික් විනිශ්චයකරු ඉදිරිපිට දී අත්සන් කළ යුතු ය ;

එසේ වුව ද පිළිගත් ඇපකාර සමාගමක ඇප සහතිකය සමාගම වෙනුවෙන් සමාගමේ ලියාපදිංචි කරන ලද කාර්යාලයේ දී අත්සන් කළ හැකි ය.

(§2, 1944 අංක 51)
(§5, 1951 අංක 6)

(3) මේ වගන්තියෙහි ''පිළිගත් ඇපකාර සමාගම'' යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ නීතිගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ද, සමාගමෙහි නිත්‍ය ව්‍යාපාරයෙහි කොටසක් වශයෙන් යම් තැනැත්තන්ගේ විශ්වාසවත් භාවය සහතික කිරීම සිරිත් වශයෙන් කරන්නා වූ ද, රජයේ නිලධරයන්ගේ (ඇප) ආඥාපනතෙහි 2 (ඇ) වන වගන්තියෙහි කාර්යයන් සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් අනුමත කරන ලද්ද වූ ද සමාගමක් අදහස් වේ.

බලපත්‍ර නොමැතිව ආදී ලෙස නොතාරිස් වශයෙන් වෘත්තියෙහි යෙදීමට දණ්ඩනය.

(§6, 1951 අංක 6)

13. ඉහත කී පරිදි වූ බලපත්‍රය නො ලබා හෝ ඉහත කී පරිදි වූ ප්‍රකාශනය ලියා අත්සන් නො කොට සහ බැඳුම්කරය නොදී හා ඇප නො තබා හෝ තම බලපත්‍රයෙහි සහතික පිටපතක් තැන්පත් නො කර යම් තැනැත්තෙක් නොතාරිස් කෙනකු ලෙස වෘත්තියෙහි යෙදෙයි නම් හෝ ක්‍රියා කරයි නම් හෝ නොතාරිස් කෙනකුගේ ධූරයෙහි යුතුකම් ඉටු කරයි නම් හෝ කටයුතු කරයි නම් එවැනි සෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ බරපතල වැඩ නැතිව හෝ ඇති ව අවුරුදු තුනකට නො වැඩි යම් කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩයට මෙන් ම බන්ධනාගාර ගත කරනු ලැබීමට ද ඔහු යටත් විය යුතුය.

ඇපකාර සමාගම නිදහස් කිරීම.

(§7, 1951 අංක 6)

14. (1) නිශ්චල දේපළ යටත් කොට බැඳ තැබීමෙන් හෝ චංචල දේපළ තැන්පත් කිරීමෙන් නොතාරිස් කෙනකු වෙනුවෙන් ඇප තබා ඇති යම් තැනැත්තකු විසින් හෝ නොතාරිස් කෙනකුට ඇපකරු වශයෙන් බැඳුණු ඇපකාර සමාගමක් විසින්, ඒ තැනැත්තා හෝ ඒ සමාගම 12 වන වගන්තිය යටතේ දරන යම් වගකීමකින් නිදහස් කරන ලෙස ඒ නොතාරිස්ගේ බලපත්‍රයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන දිස්ත්‍රික් විනිශ්චයකරුගෙන් ඉල්ලුම් කළ හැකි ය.

(2) යම් තැනැත්තකුගේ හෝ ඇපකාර සමාගමක වගකීම නිදහස් කරනු ලැබීම පිණිස ඒ තැනැත්තා හෝ සමාගම විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් කරනු ලබන දිස්ත්‍රික් විනිශ්චයකරු විසින්, ඒ ඉල්ලීම

කිරීමට ඒ තැනැත්තා හෝ සමාගම අදහස් කරන බව ඔහු හෝ සමාගම විසින් සති හයක් කල්දෙමින් නොතාරිස්ට දන්වා තිබෙන බවට හා එසේ නිදහස් කරනු ලැබීම පිණිස ඉල්ලා සිටීමට පිළිගතහැකි හේතු ඔහුට හෝ සමාගමට තිබෙන බවට තමා සෑහීමට පත්වුවහොත්, ආඥාවෙහි දිනයෙන් පසු නොතාරිස් විසින් කරනු ලබන යම්ක්‍රියාවක් පිළිබඳ කවර වගකීමකින් වුවද ඒ තැනැත්තා හෝ සමාගම නිදහස් කරමින් බැඳුම්කරය මත ආඥාවක් පිටසන් කළ හැකි ය.

15. (1) නොතාරිස් කෙනකුට ඇපකරු වශයෙන් බැඳුණු ඇපකාර සමාගමක් විසින් ස්වේච්ඡාවෙන් සමාගම විසුරුවාහැරීම සඳහා යෝජනාවක් සම්මත කර ගනු ලැබූ අවස්ථාවක,එම යෝජනාව සම්මත කර ගත් දිනයේ සිට සති හයක් ඇතුළත ඒ කරුණ ඒ නොතාරිස් වෙත ලිඛිත දැන්වීමකින් දැනුම් දිය යුතු ය.

ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීමේ යෝජනාව නොතාරිස්ට දන්විය යුතු

(§8, 1951 අංක 6)

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවේ නම්, සමාගමේ ඒ පැහැර හැරීම කළ සෑම නිලධරයකු ද ඒ පැහැර හැරීමට දැන දැනම හා ඕනෑකමින් ම බලය දුන් නැතහොත් ඉඩ දුන් සමාගමේ සෑම ඇවරකරුවකු ද වරදකට වරදකරුවන් විය යුතු අතර ඒ සම්බන්ධයෙන් වරදකරුවන් කරනු ලැබූවිට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔවුන් යටත් විය යුතු ය. මේ වගන්තියෙහි ''සමාගමේ පැහැර හරින නිලධරයෙක්'' යන්නට සමාගමේ ආඥාපනතේ 351 (2) වන වගන්තියෙහි දරන අර්ථය ම විය යුතු ය.

16. (1) යම් නොතාරිස් කෙනකු විසින් හෝ වෙනුවෙන් තබන ලද ඇපය යම් අවස්ථාවක ඌන වුවහොත් හෝ නැති වුවහොත් හෝ ඇපකරු ලෙස බැඳුනු ඇපකාර සමාගම විසුරුවා හරිනු ලැබුවොත් හෝ විසුරුවා හැරීම ආරම්භ වී ඇතහොත් හෝ නිශ්චල දේපළ යටත් කොට බැඳ තැබීමෙන් හෝ චංචල දේපළ තැන්පත් කිරීමෙන් ඇප තැබූ යම් තැනැත්තකු හෝ ඇපකරු වශයෙන් බැඳුණු යම් ඇපකාර සමාගමක් 14 (2) වන වගන්තිය යටතේ වගකීමෙන් නිදහස් කරනු ලැබුවහොත් 12 වන වගන්තියේ විධිවිධාන අනුව අලුත් බැඳුම්කරයක් ඒ නොතාරිස් විසින් ලියා අත්සන් කළ යුතු ය.

නොතාරිස් විසින් අලුතින් ඇප සැපයිය යුත්තේ කවර විට ද යන වග.

(§9, 1951 අංක 6)

(2) 1 වන උපවගන්තිය අදාළ වන යම් අවස්ථාවක දී එම උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි අලුත් බැඳුම්කරයක් ලියා අත්සන් නො කොට යම් නොතාරිස් කෙනකු නොතාරිස් වෘත්තියෙහි යෙදෙතහොත් හෝ ක්‍රියා කරතහොත් ඔහු වරදකට වරදකරු විය යුතු අතර ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට 13 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති දඬුවමට යටත් විය යුතු ය.

17. නොතාරිස් කෙනකු විසින් 12 වන වගන්තියෙන් නියමිත ප්‍රකාශනය කර එයට අත්සන් කොට ඇපය තැබූ කල්හි දිස්ත්‍රික් විනිශ්චයකරු විසින් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් නොමැතිව ඔහුගේ නම ද ඔහු නොතාරිස් කෙනකු වශයෙන් ඇතුළත් කර ගනු ලැබූ දිනය ද දිස්ත්‍රික් උසාවියෙහි ඒ සඳහා පිළියෙල කොට තබා ගත යුතු ලේඛනයක හෝ පොතක ලේඛනාරූඪ කළ යුතු අතර ඒ බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක් සමග එකී ප්‍රකාශනය සහ බැඳුම්කරය එම උසාවියේ ලේඛන ශීට්වලට ගොනු කළ යුතු ය.

නොතාරිස්වරුන් දිස්ත්‍රික් උසාවියෙහි ලේඛනාරූඪ කිරීම.

නොතාරිස්වරුන්ගේ නාමාවලිය උසාවිවල ප්‍රදර්ශනය කළ යුතු බව.

18. (1) යම් දිස්ත්‍රික්කයක් ඇතුළත නොතාරිස්වරුන් වශයෙන් ක්‍රියා කිරීමට බලය පවරන ලද සියලුම තැනැත්තන්ගේ නාමාවලියක් මහජනයාගේ දැනගැනීම පිණිස දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් උසාවි ස්ථානයෙහි ප්‍රකට තැනක සියලු කාල වේලාවල ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

(2) මිය ගියා වූ හෝ නොතාරිස්වරුන්ගේ නාමලේඛනයෙන් කපා හරිනු ලැබූ හෝ එකී දිස්ත්‍රික්කය අත්හැර ගියා වූ හෝ නොතාරිස්වරුන් වශයෙන් ඒ දිස්ත්‍රික්කයෙහි වෘත්තියෙහි යෙදීම නතර කර ඇත්තා වූ නොතාරිස්වරුන්ගේ නම් ඉවත් කිරීමෙන් උසාවියේ ලේකම් විසින් අවශ්‍ය විය හැකි පරිදි කලින් කල එකී නාමාවලිය නිවැරදි කළ යුතු ය.

(3) එක් එක් වර්ෂයේ ජූනි මාසයේ තිස් වෙනි දින හා දෙසැම්බර් මාසයේ තිස් එක් වෙනි දින, එදින තෙක් නිවැරදි කරන ලද ඒ නාමාවලියේ පිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද, දිස්ත්‍රික්කය තුළ ඒ ඒ රික්වෙස්ට් උසාවි බල සීමා ඇතුළත වෘත්තියෙහි යෙදීමට හිමිකම ඇති නොතාරිස්වරුන්ගේ නිවැරදි කළ නාම ලේඛනයක් පිළිවෙළින් ඒ දිස්ත්‍රික්කයේ විවිධ රික්වෙස්ට් උසාවි විනිශ්චයකරුවන් එක් එක් කෙනා වෙත ද ලේකම් විසින් ඉදිරිපත් කළ යුතු ය.

(4) එක් එක් රික්වෙස්ට් විනිශ්චයකරු විසින් එසේ තමා වෙත ලැබුණු නාමාවලිය තම උසාවියෙහි බිත්තිය මත ප්‍රකට ස්ථානයක සවි කර විය යුතු ය.

නොතාරිස්, ධුර යෙන් අත්හිටුවීම.

19. (1) නොතාරිස් කෙනකු දිස්ත්‍රික් උසාවියක් ඉදිරිපිට හෝ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට නඩු විභාගයකට නියම කරනු ලැබ සිටින අවස්ථාවක ඇටෝර්නි ජනරාල්ගේ ඉල්ලීම පිට ඇමතිවරයා විසින් ඔහුගේ නඩු විභාගය කෙරෙන තුරු ඔහු නොතාරිස් ධුරයෙන් අත්හිටුවිය හැකි ය. නොතාරිස් නිදහස් කරනු ලැබුවහොත් හෝ ඔහු අත්හිටුවනු ලැබීමෙන් පසු මාස හයක් ඇතුළත නඩු විභාගයට ඉදිරිපත් කරනු නො ලැබුවහොත් ඒ අත්හිටුවීම අවලංගු විය යුතු අතර එය ඉවත් කරනු ලැබූ ලෙස ද සැලකිය යුතු ය.

(2) නීතිඥයකු වූ නොතාරිස් කෙනකු ඔහුගේ නීතිඥ ධුරයෙන් අත්හිටුවනු ලැබූ අවස්ථාවක ඒ අත්හිටුවීමේ කාලය තුළ නොතාරිස් කෙනකුගේ යුතුකම් ඉටු කිරීම සඳහා ඔහු නුසුදුසු විය යුතු ය.

නොතාරිස්ගේ බලපත්‍රය අවලංගු කිරීම.

20. ඇමතිවරයාගේ මතය අනුව යම් නොතාරිස් කෙනකු වගකීමෙන් යුත් ධුරයක් භාරදීමට නුසුදුසු කරවන යම් වරදකට නීත්‍යානුකූල ව වරදකරු කරනු ලැබුවහොත් හෝ නීතිඥයකු ද වූ එවැනි යම් තැනැත්තකු යථා පරිදි නීතිඥ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් එවැනි සෑම තැනැත්තකු නොතාරිස් ධුරය සඳහා නුසුදුසු බවට පත් විය යුතු අතර ඔහුට දෙන ලද බලපත්‍රය අවලංගු කළ යුතු ය.

නොතාරිස්ගේ විෂමාචාරය හා නොහැකියාව විභාග කිරීම.

21. (1) යම් නොතාරිස් කෙනකු පදිංචි ව සිටින්නේ යම් දිස්ත්‍රික් විනිශ්චයකරුවකුගේ අධිකරණ බලසීමා ඇතුළත ද, ඒ විනිශ්චයකරු එම නොතාරිස්—

(අ) නොතාරිස් කෙනකුගේ යුතුකම් භාර දීමට දිස්ත්‍රික් විනිශ්චයකරුගේ මතය අනු ව ඔහු නුසුදුසු කරවන යම් වරදකට ඔහුගේ ධුරය වූ නොතාරිස් වශයෙන් හෝ අන් ලෙසකින් වරදකරු වී සිටින බවට ; හෝ

(ආ) ඔහුගේ ධුරයෙහි යුතුකම් ඉටු කිරීමේ දී බරපතල ලෙස විෂමාචාර යෙහි යෙදී තිබෙන බවට ; හෝ

(ඇ) මේ ආඥාපනත මගින් හෝ එය යටතේ පනවන ලද රීති අතුරින් යම් කිසිවක් නැවත නැවතත් කඩකිරීමෙන් එකී යුතුකම් ඉටු කිරීම ඔහුට තවදුරටත් භාර නො දිය යුතු තත්ත්වයට පත්ව සිටින බවට ; හෝ

(ඈ) 31 වන වගන්තියෙහි (26) වන රීතියේ විධිවිධාන කඩ කිරීමකට හෝ නො සලකා හැරීමකට හෝ පිළිපැදීම පැහැර හැරීමකට තුන් වරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු වී ඇති බවට ; හෝ

(ඉ) මහජනයාට ප්‍රයෝජනවත් ලෙස සිය ධුරයේ කටයුතු කරගෙන යාමට තමා අපොහොසත් බව අදක්ෂතාවය, වයස් ගතවීම හෝ ශාරීරික හෝ මානසික දුර්වලතාවය මගින් හෝ අන් අයුරින් පෙන්නුම් කර ඇති බවට,

නිසි විභාගයකින් පසු සෑහීමට පත් වූ විට, විභාගයේ දී සටහන් කර ගත් සාක්ෂි ද සමග එම කරුණු ඇමතිවරයා වෙත ලියවිල්ලකින් වාර්තා කිරීම ඔහුගේ යුතුකම විය යුතු ය.

(2) ඉහත අන්තිමට දක්වුණු උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) යන අකුරු වගන්තිවල සඳහන් යම් වරදක් හෝ විෂමාචාරයක් සම්බන්ධයෙන් නොතාරිස් වරදකරු වී ඇති බව වාර්තාවෙන් ප්‍රකාශ වන අවස්ථාවක ඒ නොතාරිස්ගේ බලපත්‍රය අවලංගු කිරීම හෝ සාධාරණ යැයි පෙනී යන කාල සීමාවකට ඔහු ධුරයෙන් අත්හිටුවීම ඇමතිවරයා විසින් කළ හැකි ය. මහජනයාට ප්‍රයෝජනවත් ලෙස ඔහුගේ යුතුකම් ඉටු කිරීමට නොතාරිස් අපොහොසත් බව වාර්තා වෙන් ප්‍රකාශ වන අවස්ථාවක ඔහුගේ බලපත්‍රය අවලංගු කිරීම හෝ නිශ්චිත ව සඳහන් කාලයක් ඇතුළත ධුරයෙන් ඉල්ලා අස්වීමට ඔහුට නියම කිරීම ඇමතිවරයා විසින් කළ හැකි අතර, එසේ ඉල්ලා අස්වීම පැහැර හැරියහොත් බලපත්‍රය අවලංගු කළ හැකි ය.

(3) ඒ විභාගයේ කාර්යයන් සඳහා නොතාරිස්ට සහ යම් සාක්ෂිකරුවන්ට තමා ඉදිරිපිට පෙනී සිටින ලෙස නියම කිරීමේ ද වැදගත් ය යි දිස්ත්‍රික් විනිශ්චයකරු විසින් සැලකිය හැකි යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ ද ඒ සාක්ෂිකරුවන් දිවුරුම් පිට හෝ සහතික ප්‍රකාශ පිට පරීක්ෂා කිරීමේ ද ඒ නොතාරිස් දිවුරුම් හෝ සහතික ප්‍රකාශ නොමැති ව පරීක්ෂා කිරීමේ ද බලය දිස්ත්‍රික් විනිශ්චයකරුට තිබිය යුතු ය.

(4) ඉහත කී පරිදි පෙනී සිටින ලෙස හා පරීක්ෂා කරනු ලබන ලෙස හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් තැනැත්තකු යුක්ති සහගත හේතුවක් නොමැති ව ඒ නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හරිතහොත් ඔහු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

(5) විභාගයේ දී නොතාරිස් විසින් කරනු ලබන කිසිම ප්‍රකාශයක් ඔහුට විරුද්ධ ව කරනු ලබන යම් අපරාධ නඩු පැවරීමක දී ප්‍රයෝජනයට නො ගත යුතු ය.

ධුරයෙන් ඉල්ලා අස්වීම

22. (1) නොතාරිස් කෙනෙකු නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීම පිණිස හා ඒ ධුරයෙහි ක්‍රියා කිරීම අවසාන කිරීම පිණිස රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් ලියවිල්ලකින් ඉල්ලුම් කරන්නේ නම් එම ඉල්ලීම රෙජිස්ට්‍රාර්



2—ජේ 7440 (71/9)

ජනරාල් විසින් නොපමාව ඇමතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර නොතාරිස් විසින් අපේක්ෂිත දිනයේ සිට ඒ ඉල්ලා අස්වීම ඇමතිවරයා විසින් භාර ගත හැකි ය.

(2) මේ වගන්තිය යටතේ නොතාරිස් කෙනකු ඉල්ලා අස් වූ විට 23, 24, 25 සහ 26 වන වගන්තිවල කාර්යයන් සඳහා ඔහුගේ බලපත්‍රය අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ඒ ඉල්ලා අස්වීම එසේ වුව ද එය නො තකා, ඉල්ලා අස්වීමට පෙර නොතාරිස් කෙනකු වශයෙන් තමාට අයත් කටයුතු කිරීමේ දී තමා විසින් කරන ලද හෝ නො කර හරින ලද සියලුම දේවල් සම්බන්ධයෙන් මේ ආඥපනතේ විධිවිධානවලට හා එහි අන්තර්ගත හෝ එය යටතේ පනවන ලද සියලු ව්‍යවස්ථාවලට යටත් ව, ඔහු එලෙස සිටිය යුතු ය.

බලපත්‍රය අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ සහතිකය ප්‍රදේශයේ උසාවිවලට යැවිය යුතු බව සහ ඒ ප්‍රදර්ශනය කර තැබිය යුතු බව.

23. (1) නොතාරිස් කෙනකුගේ බලපත්‍රය අවලංගු කළ හෝ නොතාරිස් කෙනකු ඔහුගේ ධුරයෙන් අත්හිටුවනු ලැබූ කවර අවස්ථාවක වුවත් ගැසට් පත්‍රයෙහි ඒ පිළිබඳ දැන්වීමක් පළ කළ යුතු අතර, ඒ බලපත්‍රය අවලංගු කර ඇති බවට හෝ ඒ නොතාරිස් අත්හිටුවනු ලැබූ බවට සහතිකයක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද ඒ නොතාරිස්ට ක්‍රියා කිරීමට බලය පවරා තිබුණේ යම් අධිකරණ බලසීමා තුළ ද එහි දිස්ත්‍රික් විනිශ්චයකරු වෙත හා විවිධ රික්වෙස්ට් විනිශ්චයකරුවන් වෙත ද අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් යැවිය යුතු ය.

(2) ඒ නොතාරිස්ගේ නම ලේඛනාරූඪ කර ඇත්තේ යම් උසාවියක ද ඒ උසාවියේ දිස්ත්‍රික් විනිශ්චයකරු විසින්, නොතාරිස්ගේ බලපත්‍රය අවලංගු කළ අවස්ථාවක දී නොතාරිස්වරුන්ගේ නාමලේඛනයෙන් ඔහුගේ නම වහා ඉවත් කරවිය යුතු අතර නොතාරිස් ඔහුගේ ධුරයෙන් අත්හිටවනු ලැබූ අවස්ථාවක දී නාමලේඛනයෙහි ඔහුගේ නම ඉදිරියෙන් ඒ කරුණ සටහන් කළ යුතු ය.

(3) ඒ සහතිකයේ පිටපතක්, එයට අමුණන ලද එහි සිංහල හා දෙමළ භාෂාමය පරිවර්තනයකුත් සමඟ, ඒ සෑම දිස්ත්‍රික් උසාවියක සහ රික්වෙස්ට් උසාවියක ප්‍රකට ස්ථානයක උසාවිය විසින් නියම කළ හැකි කාලයක් ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

අත්හිටුවීම ආදිය දැන්වීමෙන් පසු වෘත්තියෙහි යෙදෙන නොතාරිස්වරුන්ට දණ්ඩනය.

24. ඉහත කී පරිදි වූ යම් අත්හිටුවීමක් පිළිබඳ දැන්වීම ලැබීමෙන් පසු හා එය ඉවත් කරනු ලැබීමට පෙර හෝ නොතාරිස් කෙනකුගේ ධුරයට තමා නුසුදුසු කරවන වරදකට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ මෙහි මීට පෙර සඳහන් කරනු ලැබූ පරිදි, නීතිඥ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් පසු, හෝ තමාට දෙන ලද බලපත්‍රය ඉහත කී පරිදි අවලංගු කරන ලද බවට හෝ ඉවත් කර ගන්නා ලද බවට දැන්වීමක් ලැබීමෙන් පසු යම් තැනැත්තකු නොතාරිස් කෙනෙකුගේ ධුරයෙහි ක්‍රියා කළහොත් හෝ නොතාරිස් කෙනෙකුට අයත් කටයුතු කළහොත් ඔහු වරදකට වරදකරු විය යුතු අතර ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසකට නො වැඩි දඩයකට හෝ බරපතල වැඩ නැති ව හෝ ඇති ව අවුරුදු තුනකට නො වැඩි යම් කාලයකට බන්ධනාගාර ගතකරනු ලැබීමට හෝ ඒ දඩයට මෙන් ම බන්ධනාගාර ගත කරනු ලැබීමට ද ඔහු යටත් විය යුතු ය.

**බලපත්‍රය අවලංගු කිරීම ඇමතිවරයා විසින් නිෂ්ප්‍රභ කළ හැකි බව.**

(§10, 1951 අංක 6)

25. (1) මේ ආඥාපනතෙහි විධිවිධාන යටතේ නොතාරිස් කෙනකුගේ බලපත්‍රය ඉවත් කරනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ යම් අවස්ථාවක දී ඇමතිවරයා විසින් ඒ ඉවත් කිරීම හෝ අවලංගු කිරීම නිෂ්ප්‍රභ කරමින් ආඥාවක් කළ හැකි අතර ඒ ඉවත් කිරීමට හෝ අවලංගු කිරීමට පෙරාතුව ම ඔහු වෘත්තියෙහි යෙදෙමින් සිටි ප්‍රදේශය ඇතුළත හෝ අන් කිසි ප්‍රදේශයක් ඇතුළත වෘත්තියෙහි යෙදීමට බලය පවරමින් ඔහුට අලුත් බලපත්‍රයක් ද නිකුත් කළ හැකි ය.

**නිෂ්ප්‍රභ කිරීමේ දැන්වීම.**

(§10, 1951 අංක6)

(2) ඒ ආඥාව පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එහි පිටපතක් මේ වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අලුත් බලපත්‍රයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන දිස්ත්‍රික් විනිශ්චයකරු වෙත ද එකී ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන විවිධ රික්වෙස්ට් විනිශ්චයකරුවන් වෙත හා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් යැවිය යුතු ය.

**නොතාරිස්ගේ නම ආදිය නොතාරිස් වරුන්ගේ නාම ලේඛනයට ආපසු යෙදීම හෝ එහි ඇතුළත් කිරීම.**

(§11,1951 අංක 6)

26. (1) 25(2) වන වගන්තිය යටතේ යවන ලද දැන්වීමක් දිස්ත්‍රික් විනිශ්චයකරු වෙත ලැබුණු විට, නොතාරිස්ගේ අලුත් බලපත්‍රය තමා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ නොතාරිස්ගේ නම ඔහු විසින් නොතාරිස් වරුන්ගේ නාමලේඛනයට ආපසු යෙදිය යුතු ය ; නොහොත් එහි ඇතුළත් කළ යුතු ය.

(2) නොතාරිස් කෙනකුගේ නම නොතාරිස්වරුන්ගේ නාමලේඛනයට ආපසු යොදන හෝ එහි ඇතුළත් කරන දිස්ත්‍රික් විනිශ්චයකරු විසින් 12 වන වගන්තියෙහි ප්‍රකාර අලුතින් ඇප තබන ලෙස ඒ නොතාරිස්ට නියම කළ යුතු ය.

(3) මේ වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ නොතාරිස්වරුන්ගේ නාමලේඛනයට සිය නම ආපසු යොදනු ලැබූ හෝ එහි එය ඇතුළත් කරනු ලැබූ ද 12 වන වගන්තියෙහි ප්‍රකාර අලුත් ඇපයක් සපයනු ලැබූ ද සෑම නොතාරිස් කෙනෙකුට ම ඔහුගේ අලුත් බලපත්‍රයෙන් ඔහුට දෙන ලද බලයට අනුකූල ව නොතාරිස් කෙනකුගේ ධුරයෙහි ක්‍රියා කිරීමට හිමිකම් තිබිය යුතු ය.

**නොතාරිස් වරුන්ට වර්ෂයක් පාසා දිස්ත්‍රික් උසාවියේ ලේකම් විසින් සහතික දියයුතු බව.**

27. (1) දිස්ත්‍රික් උසාවියක අධිකරණ බලසීමා ඇතුළත නොතාරිස් කෙනකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති යම් තැනැත්තකු විසින් ඉල්ලුම් කළ විට ඒ තැනැත්තා නොතාරිස් කෙනකු බවට හා ඒ සීමා ඇතුළත එසේ වෘත්තියෙහි යෙදීමට ඔහුට යථා පරිදි බලය පවරා ඇති බවට ඔහු වෙත සහතිකයක් නිකුත් කිරීම ඒ සෑම දිස්ත්‍රික් උසාවියක ලේකම්ගේ යුතුකම විය යුතු ය.

(2) එවැනි සියලුම සහතික ඉල්ලුම් කිරීම ද දීම ද සෑම වර්ෂයක මාර්තු මස පළමුවන දින හෝ එදිනට පෙර කළ යුතු අතර ඒවා අවුරුද්දක කාලයක් මුත් ඊට වැඩි කලක් වලංගු නො විය යුතු ය :

(2, 1943 අංක 59)

එසේ වුව ද, සීමා කරන ලද කාලය ඇතුළත ඒ සහතිකය සඳහා ඉල්ලුම් කරනු නො ලැබුවහොත් හා ඒ ප්‍රමාදය සිදුවූයේ හදිසියක් හෝ ආපදවක් හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බව දිස්ත්‍රික් විනිශ්චයකරු සෑහීමට පත් වන පරිදි පෙන්නුම් කරනු ලැබුවහොත් ඉහත කී ඒ ප්‍රමාදය නො තකා අවශ්‍ය සහතිකය නිකුත් කරන ලෙස දිස්ත්‍රික් විනිශ්චයකරු විසින් ලේකම්ට විධාන කළ හැකි ය.



3—මක් 7440 (71/9)

(3) ඒ සහතිකය දෙවන උපලේඛනයෙහි දක්වෙන ''ඇ'' ආකෘතියෙහි විය යුතු අතර රුපියල් දහයක මුද්දර ගාස්තුවක් ද දැරිය යුතු ය :

එසේ වුව ද, යම් දිස්ත්‍රික්කයකට හෝ ස්ථානයට අදාළ තත්ත්වයන් මුද්දර නො ගැසූ කඩදාසියක සහතිකය නිකුත් කිරීම අවශ්‍ය කරවන හෝ යෝග්‍ය කරවන ආකාරයේ බව ඇමතිවරයාට පෙනී යන යම් අවස්ථාවක මුද්දර නො ගැසූ කඩදාසියක එවැනි යම් සහතිකයක් නිකුත් කිරීමට ඇමතිවරයා විසින් බලය දීම නීත්‍යානුකූල විය යුතු ය.

සහතික ඉල්ලුම් කරන නොතාරිස් වරුන් ප්‍රකාශන යක් කළ යුතු බව.

28. (1) එවැනි සහතිකයක් ලබා ගැනීමේ කාර්‍යය සඳහා ඒ නොතාරිස් විසින් අත්සන් කළ, පහත සඳහන් විස්තර ඇතුළත්, එනම් :—

(අ) ඔහුගේ නම සහ පදිංචි ස්ථානය හෝ ස්ථාන ;

(ආ) ඔහුගේ කාර්‍යාලය හෝ ඔහුගේ එක් එක් කාර්‍යාලය පිහිටි නියම ස්ථානය ;

(ඇ) ඔහුට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති ප්‍රදේශය ; සහ

(§12, 1951 අංක 6).

(ඈ) මේ වගන්තිය යටතේ මීට පෙර යම් ප්‍රකාශනයක් කරන ලද නම් එහි දිනයෙන් පසු යම් විටෙක ඔහු විසින් හෝ වෙනුවෙන් තබන ලද ඇපය සුන් වී ද නොහොත් නැති වී ද, නැතහොත් ඔහුගේ ඇප කරු වශයෙන් බැඳුණු ඇපකාර සමාගම විසුරුවා හරිනු ලැබුවේ ද නොහොත් විසුරුවා හැරීමේ කටයුතු ආරම්භව තිබේ ද නැතහොත් නිශ්චල දේපළ යටත් කොට බැඳ තැබීමෙන් හෝ චංචල දේපළ තැන්පත් කිරීමෙන් ඇප තැබූ යම් තැනැත්තකු හෝ එවැනි යම් ඇපකාර සමාගමක් 14(2) වන උපවගන්තිය යටතේ වගකීමෙන් නිදහස් කරනු ලැබුවේ ද යන වග

ඇතුළත් ලියවිල්ලෙන් වූ ප්‍රකාශනයක් එකී ලේකම් වෙත භාර දිය යුතු අතර, ඒ ප්‍රකාශනය තමා වෙත භාර දෙනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් (ඒ සහතිකය ඉල්ලුම් කරන පාර්ශ්වය නොතාරිස්වරුන්ගේ නාමලේඛනයෙහි සඳහන් ව නැති බව හෝ ඒ දිස්ත්‍රික්කයෙහි එසේ වෘත්තියෙහි යෙදීමට එම පාර්ශ්වයට බලය පවරා නොමැති බව හෝ මේ ආඥාපනතින් නියමිත පරිදි ඒ පාර්ශ්වය විසින් ඇප තබා නොමැති බව විශ්වාස කිරීමට තමාට කරුණු පෙනී යතහොත් සහ හේතු ඇතහොත් මිස) ඉහත කී පරිදි වූ ඒ සහතිකය ලේකම් විසින් නොතාරිස් වෙත භාර දිය යුතු ය.

(§7, 1947 අංක 48)

(2) නීතිඥයකු වූ නොතාරිස් කෙනෙකු (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශනයෙහි තමා පදිංචි ස්ථාන එකකට වැඩි ගණනක් දක්වන අවස්ථාවක, තමා කාර්‍යාලය වශයෙන් පාවිච්චි කිරීමට අදහස් කරන හෝ පාවිච්චි කරන ස්ථානය ඉන් කවර ස්ථානය ද යන්න එම ප්‍රකාශනයෙහි වැඩි දුරටත් ඔහු විසින් සඳහන් කළ යුතු ය.

(3) එවැනි යම් ප්‍රකාශනයක යම් තැනැත්තකු විසින් යම් අසත්‍ය ප්‍රකාශ යක් කරතහොත් ඔහු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

ලේකම් විසින් යම් සහතිකයක් දීම ප්‍රතික්ෂේප කළ විට දිස්ත්‍රික් උසාවිය වෙත ඉල්ලුම් කළ යුතු බව.

29. (1) යම් නොතාරිස් කෙනකුට ඉහත කී පරිදි වූ යම් සහතිකයක් නිකුත් කිරීම ලේකම් විසින් ප්‍රතික්ෂේප කළහොත් නොතාරිස් විසින් දිස්ත්‍රික් උසාවිය වෙත ඉල්ලුම් කළ හැකි අතර ඒ කරුණ සම්බන්ධයෙන් සාධාරණ විය යුතු ආඥාවක් කිරීමට ඒ උසාවියට මෙයින් බලය පවරනු ලැබේ.

(2) මේ වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවකින් හෝ 27(2) වන වගන්තියේ අතුරු විධානයෙහි සඳහන් යම් අවස්ථාවක දී සහතිකයක් නිකුත් කරන ලෙස විධාන කිරීම දිස්ත්‍රික් විනිශ්චය කරු විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් විසින් ඒ ආඥාවට හෝ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඇපෑල් ගත හැකි ය.

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඇපෑල් ගැනීම.
(§3, 1943 අංක 59)

(3) ඒ ඇපෑල දිස්ත්‍රික් උසාවියක අන්තර් ආඥාවට විරුද්ධ ඇපෑලක් ලෙස සැලකිය යුතු ය.

30. යම් තැනැත්තකු ඉහත කී පරිදි වූ සහතිකයක් නො ලබා නොතාරිස් කෙනකු වශයෙන් ක්‍රියා කරතහොත් එවැනි සහතිකයක් නොමැතිව සිටිය දී ඒ නොතාරිස් වශයෙන් ඔහු ඉදිරිපිට ලියා අත්සන් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ සෑම ඔප්පුවක් වෙනුවෙන් හා සම්බන්ධයෙන් ඔහු වරදකට වරදකරු විය යුතු අතර රුපියල් පනහකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

සහතික නොමැතිව වෘත්තියෙහි යෙදෙන නොතාරිස්වරුන්ට දණ්ඩනය.
(§3, 1943 අංක 7)

31. පහත සඳහන් රීති තරයේ පිළිපැදීම සහ ඒවාට අනුකූල ව ක්‍රියා කිරීම සෑම නොතාරිස් කෙනකුගේ යුතුකම ය ; එමෙන් ම එය ඔහුගේ යුතුකම විය යුතු ය. ඒ ව්‍යවස්ථා නම් :—

නොතාරිස්වරු පිළිපැදිය යුතු රීති.

(1) තමා කෙරෙහි විශ්වාසය තබා කියන ලද හෝ තමාගේ ධූරයේ කටයුතු කිරීමේ දී තමා අතට පත් වන රහස් තම සේවායෝජකයාගේ ප්‍රකාශිත අවසරය ඇති ව මිස හෝ එළි කිරීමට නීතියෙන් නියම වූ විට හැර ඔහු විසින් එළිදරව් නො කළ යුතු ය.

නොතාරිස්, අවසර නොමැතිව රහස් එළිදරව් නො කළ යුතු බව.

(2) ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය තමා විසින් පිළියෙල කරන ලද බව සහතික කරමින් නොතාරිස් කෙනකු විසින් අත්සන් කළ සහතිකයක් ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය මත පිටසන් කරනු ලැබුවහොත් මිස අන් කිසි තැනැත්තකු විසින් ලංකාවේ දී පිළියෙල කරන ලද ඔප්පුවක හෝ නීත්‍යානුකූල ලේඛනයක තත්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය.

අන් කිසි තැනැත්තකු පිළියෙල කළ ලේඛන ලියා සහතික කිරීම.

(3) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන හෝ ලියා අත්සන් කිරීමට ඇති යම් ඔප්පුවක හෝ නීත්‍යානුකූල ලේඛනයක යම් පාර්ශ්වකරුවකුට හෝ යම් සාක්ෂිකරුවකුට එම සම්පූර්ණ ඔප්පුව ම හෝ සම්පූර්ණ නීත්‍යානුකූල ලේඛනය ම ලියා හෝ නීත්‍යානුකූල ව සකසා අවසන් කරන තුරු ඒ ඔප්පුවට හෝ නීත්‍යානුකූල ලේඛනයට හෝ එහි අනුපිටපතකට හෝ අන් කොටසකට හෝ තමාගේ ප්‍රථම ලේඛනයේ තබා ගැනීමට අදහස් කරන එහි යම් කෙටුම්පතකට හෝ පිටපතකට ඔහුගේ නම අත්සන් කිරීමට හෝ සලකුණු තැබීමට හෝ එය පිළිගැනීමට, හෝ එවැනි යම් කාර්‍යයක් සඳහා යොදා ගැනීමට අදහස් කරන ලද යම් කඩදාසියකට හෝ වෙනත් ද්‍රව්‍යයකට ඔහුගේ නම අත්සන් කිරීමට හෝ සලකුණු තැබීමට නොතාරිස් විසින් නියම නො කළ යුතු ය ; අවසර නො දිය යුතු ය ; ඉඩ නො දිය යුතු ය.

ඔප්පුවක පාර්ශ්වකරුවකුගේ හෝ සාක්ෂිකරුවකුගේ අත්සන ගත හැක්කේ කවර විට ද යන වග.

ඔප්පු ලිවිය හැක්කේ කුමක් මත ද යන වග.

(4) ලේඛනයෙහි කාර්ය සඳහා සුදුසු ප්‍රමාණවත් කලක් පවතින වර්ගයකට අයත් නො වූ කඩදාසියක ලියන ලද යම් ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක තත්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු අතර, පුස්කොළවල ලියූ ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක තත්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ද ඔහු විසින් නො කළ යුතු ය.

ඉඩම් රෙජිස්ට්‍රාර් අත්සන් කළ නො බැඳු පත්ඉරුවක හෝ පත්ඉරුවල ඔප්පු ලිවිය යුතු බව.

(5) (අ) පාවිච්චි කරන ලද පත්ඉරුවල හෝ කැබලිවල එක් එක් පත්ඉරුව හෝ කැබෙල්ල නොතාරිස් පදිංචි ව සිටින දිස්ත්‍රික්කය සඳහා වූ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත කලින් ඉදිරිපත් කරනු ලැබ ඇතහොත් හා අන් කිසි කාර්යයක් සඳහා යොදා ගැනීම වැළැක්වීම පිණිස ඒ පත්ඉරු හෝ කැබලි ඒ රෙජිස්ට්‍රාර් විසින් ලකුණු කොට හෝ අත්සන් කොට හෝ ඒවාට කෙටි අත්සන තබා ඇතහොත් මිස ; හෝ

(ආ) ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියා අත්සන් කරන පාර්ශ්වකරුවන් හා නොතාරිස් විසින් ඔප්පුවෙහි හෝ නීත්‍යනුකූල ලේඛනයෙහි කවර හෝ කොටසක් ලියා ඇති සෑම පත්ඉරුවකම හෝ සෑම කැබෙල්ලක ම අත්සන් තබන ලද නම් මිස සම්පූර්ණ හෝ නො බැඳූ කඩදාසි, හම්පත් හෝ වෙනත් ද්‍රව්‍යයක පත්ඉරු හෝ කැබලි එකකට වැඩි ගණනක ලියන ලද යම් ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක තත්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතුය.

අඩුවෙන් මුද්දර ගැසූ නීත්‍යනුකූල ලේඛනය ලියා අත්සන් නො කළ යුතු බව.

(6) අඩුවෙන් මුද්දර ගසන ලද යම් ඔප්පුවක් හෝ නීත්‍යනුකූල ලේඛනයක් තමා ඉදිරිපිට ලියා අත්සන් කිරීමට හෝ පිළිගැනීමට යම් තැනැත්තකුට නියම කිරීම, අවසර දීම හෝ ඉඩ දීම ඔහු විසින් නො කළ යුතු ය.

ඔප්පුව ලියා අත්සන් කරන වේලාවෙහි මුද්දර අවලංගු කළ යුතු බව.

(7) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන හෝ පිළිගනු ලබන ලාංජන මුද්‍රාවෙන් මුද්දර නො ගැසූ සෑම ඔප්පුවක ම හෝ සෑම නීත්‍යනුකූල ලේඛනයක ම ඇති මුද්දර ඒ එක් එක් මුද්දරය මත හෝ හරහට තම නම හෝ නමෙහි මුලකුරු තීන්තෙන් ලිවීමෙන් හෝ සටහන් කිරීමෙන් එම ලියා අත්සන් කිරීම හෝ පිළිගැනීම කරන වේලාවෙහි ඔහු විසින් අවලංගු කළ යුතු අතර තමා එසේ ලියන්නා වූ හෝ සටහන් කරන්නා වූ නිවැරදි දිනය ද ඒ සමග යෙදිය යුතු ය. තවද ඒ එක් එක් මුද්දරය මත, ඒ මුද්දරය අලවන ලද ඔප්පුවේ හෝ නීත්‍යනුකූල ලේඛනයේ අංකය තීන්තෙන් ලිවිය යුතු ය.

සෑම ඔප්පුවකට ම සාක්ෂිකරුවන් දෙදෙනකු අවශ්‍ය බව.

(8) යටත් පිරිසෙයින් සාක්ෂිකරුවන් දෙදෙනකු ඔවුන්ගේ අත්සන් අකුරෙන් නො යෙදූ කිසිම ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක තත්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය.

(9) යම් ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කරන තැනැත්තා හෝ ඔප්පුවට හෝ නීත්‍යානුකූල ලේඛනයට සාක්ෂි දරන සාක්ෂිකරුවන් යටත් පිරිසෙයින් දෙදෙනකු තමා දනිතහොත් මිස ඒ ඔප්පුවේ හෝ නීත්‍යානුකූල ලේඛනයේ තථ්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය ; තව ද පසුව සඳහන් කළ අවස්ථාවේ දී ඒ සාක්ෂිකරුවන්, සාක්ෂිකරුවන් වශයෙන් පිළිගැනීමට පෙර ඔවුන් හොඳනමක් ඇති අය බවට ද ලියා අත්සන් කරන්නා හොඳින් හඳුනන බවට ද ඔහුගේ නියම නම, රක්ෂාව සහ පදිංචි ස්ථානය ඔවුන් දන්නා බවට ද නොතාරිස් සෑහීමට පත් විය යුතු අතර, ලියා අත්සන් කරන්නා තමන් හොඳින් දන්නා බවට සහ ඔහුගේ නියම නම, රක්ෂාව සහ පදිංචි ස්ථානය තමන් දන්නා බවට ඒ සාක්ෂිකරුවන් විසින් ඔප්පුවෙහි හෝ නීත්‍යානුකූල ලේඛනයෙහි පහතින් ප්‍රකාශනයක් අත්සන් කළ යුතු ය.

නොතාරිස් හෝ සාක්ෂි දරන සාක්ෂිකරුවන් දෙදෙනකු ඔප්පුව ලියා අත්සන් කරන පාර්ශ්වය දන සිටිය යුතු බව.

(10) යම් ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කරන තැනැත්තා සහ එයට සාක්ෂි දරන සාක්ෂිකරුවන් යන දෙපාර්ශ්වය ම තමා නො දන්නා යම් අවස්ථාවක දී එහි තථ්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය.

නොතාරිස්, ඔප්පුව ලියා අත්සන් කරන තැනැත්තා සහ සාක්ෂි දරන සාක්ෂිකරුවන් යන දෙපාර්ශ්වය ම නො දන්නා අවස්ථාවක ඔප්පුව ලියා අත්සන් නො කළ යුතු බව.

(11) ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලියා අත්සන් කරන හෝ පිළිගන්නා තැනැත්තාට එය කියවීමට නො හැකි, හෝ කියවිය නො හැකි බව ඔහු විසින් පවසන, හෝ එය කියවා දෙන මෙන් ඒ තැනැත්තා තමාගෙන් ඉල්ලා සිටින යම් අවස්ථාවක දී ඒ තැනැත්තා ඉදිරිපිට සහ ඔහුට ඇසෙන සේ, හා අන්තිම කැමති පත්‍ර හා ඌණ පූරණ පත්‍ර සම්බන්ධයෙන් හැර සාක්ෂි දරන සාක්ෂිකරුවන් ඉදිරිපිට දී, එය තමා විසින් කියවා තේරුම් කර දෙන ලද නම් හෝ, කියවා තේරුම් කර දීමට සලස්වන ලද නම් මිස හා එසේ කරන තුරු යම් ඔප්පුවක හෝ නීත්‍යානුකූල ලේඛනයක තථ්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය.

ඔප්පුව කියවා තේරුම් කර දිය යුත්තේ කවර විට ද යන වග.

(12) ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලිය අත්සන් කරන තැනැත්තා සහ සාක්ෂිකරුවන් විසින් තමා ඉදිරිපිට දී සහ ඔවුනොවුන් ඉදිරිපිට දී එය අත්සන් කරනු ලැබුවහොත් ද මිස, ලියා අත්සන් කරන්නා සහ සාක්ෂි දරන සාක්ෂිකරුවන් ඉදිරිපිට දී තමා එය අත්සන් කළහොත් ද මිස යම් ඔප්පුවක හෝ නීත්‍යානුකූල ලේඛනයක තථ්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය.

ඔප්පුවක් ලියා සහතික කළ හැක්කේ කවර විට ද යන වග.

(13) තමා පාර්ශ්වකරුවකු වූ කිසිම ඔප්පුවක හෝ නීත්‍යානුකූල ලේඛනයක තථ්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය.

නොතාරිස් විසින් සහතික නො කළ හැකි ඔප්පු කවරේ ද යන වග.

(14) යම් පාර්ශ්වකරුවකු හෝ සාක්ෂිකරුවකු විසින් ඔප්පුවක් හෝ නීත්‍යනුකූල ලේඛනයක් අත්සන් කිරීමට පෙර ඒ පාර්ශ්වකරුගේ හෝ සාක්ෂිකරුගේ සම්පූර්ණ නම ඔහු විසින් විමසා දන ගත යුතු අතර ඒ පාර්ශ්වකරුගේ හෝ සාක්ෂිකරුගේ අත්සන ඒ පාර්ශ්වකරු හෝ සාක්ෂිකරු විසින් දෙන ලද නමට වෙනස් නම් නොතාරිස් විසින් ඒ නමින් සහ අත්සනෙහි ලියන ලද නමින් ද ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය පිළිබඳ තම ලියා සහතික කිරීමෙහි ඒ පාර්ශ්වකරු හෝ සාක්ෂිකරු විස්තර කළ යුතු ය ;

පාර්ශ්වකරුවන් සහ සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් විමසා දන ගත යුතු බව.

(15) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන හෝ පිළිගනු ලබන ඔප්පුවක් හෝ නීත්‍යනුකූල ලේඛනයක් එහි පාර්ශ්වකරුවන්ගෙන් හෝ සාක්ෂිකරුවන්ගෙන් යමකු විසින් සලකුණකින් හෝ නොතාරිස්ට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති භාෂාව නො වන භාෂාවකින් වූ අත්සනකින් අත්සන් කරනු ලැබුවහොත්, ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියා අත්සන් කරන වේලාවේ දී ඒ සලකුණ හෝ අත්සන මත ''මෙය ඒ.බී. ගේ (සලකුණින් හෝ අත්සනින් අත්සන් කරන තැනැත්තාගේ නම මෙහි යොදනු) සලකුණ (නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, අත්සන) වේ'' යන වචන ඔහු විසින් තමාගේ අත් අකුරින් ලිවිය යුතු ය ; තව ද සලකුණක් සම්බන්ධයෙන් වූ විට ඉහත නියමයට අමතරව ඒ ඔප්පුවට හෝ නීත්‍යනුකූල ලේඛනයට වම් මාපටඇඟිල්ලෙහි සටහන තැබීමට ඒ තැනැත්තාට නියම කොට ඉහත කී වේලාවෙහි හා ආකාරයට එම සටහන මත ''මෙය ඒ.බී. ගේ (මාපටැඟිලි සටහන යම් තැනැත්තකුගේ ද ඔහුගේ නම මෙහි ඇතුළත් කරනු) වම් මාපටැඟිලි සටහන වේ'' යන වචන ලිවිය යුතු ය ;

සලකුණකින් අත්සන් කළ ඔප්පුවක් සම්බන්ධයෙන් නොතාරිස්ගේ යුතුකම.

(16) (අ) ඉඩමෙහි හෝ වෙනත් දේපළෙහි මායිම් (දිය හැකි සෑම විටකම එයට යාබද ඉඩම්වල සහ ඒවායේ අයිතිකරුවන්ගේ නම් ද ඊට ඇතුළත් විය යුතු ය.), එහි විය හැකි බිම් ප්‍රමාණය හා (නගරය හෝ ගම, පත්තුව, කෝරළය, පාලන දිස්ත්‍රික්කය සහ පළාතට සම්බන්ධව) පිහිටීම සහ නම ද වරිපනම් අංකයක් වෙතොත් එය ද දක්වන විස්තරයක් ඔප්පුවෙහි හෝ නීත්‍යනුකූල ලේඛනයෙහි හෝ එයට යාකොට ඇති උපලේඛනයක අන්තර්ගතව ඇත හොත් මිස අන්තිම කැමති පත්‍රයක් හෝ ඌණ පූරණ පත්‍රයක් නො වන ඉඩම් හෝ වෙනත් නිශ්චල දේපළ කෙරෙහි බලපාන යම් ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක තත්‍යභාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නො කළ යුතු ය.

නිශ්චල දේපළවලට බලපාන ඔප්පු.

(ආ) ඒ දේපළ ඉඩමක නැතහොත් වෙනත් දේපළක කොටසකින් සමන්විත වේ නම් එය බෙදූ හෝ නොබෙදූ කොටසක් ද යන බවත් සම්පූර්ණ ඉඩමෙන් කවර භාගයක් ද යන්නත් ඔප්පුවෙහි ප්‍රකාශ විය යුතු ය. එය බෙදූ කොටසක් නම් එහි විශේෂ මායිම්වලින් සහ ප්‍රමාණයෙන් පැහැදිලි ලෙසත් නිවැරදි ලෙසත් ඒ කොටස විස්තර කළ යුතු ය ; එය නොබෙදූ කොටසක් නම් එය කොටසක් වූ සම්පූර්ණ ඉඩමෙහි මායිම් සහ ප්‍රමාණය සඳහන් කළ යුතු ය :

එසේ වුව ද එවැනි යම් දේපළක් හිමිකර දීමේ, උකස් කිරීමේ හෝ බදු දීමේ යම් ගිවිසුමකට මෙම ව්‍යවස්ථාව අදාළ නො විය යුතු ය.

(17) (අ) ඔහු විසින් ඉඩමක හෝ වෙනත් නිශ්චල දේපළක සම්බන්ධතාවය කෙරෙහි බලපාන (අන්තිම කැමති පත්‍රයක් හෝ ඌණ පූරණ පත්‍රයක් නො වන) යම් ඔප්පුවක් හෝ නීත්‍යනුකූල ලේඛනයක් පිළියෙල කිරීමට පෙර එම ඉඩම පිළිබඳ අයිතියෙහි තත්ත්වය හා එම ඉඩමෙහි යම් සම්බන්ධතාවයකට බලපාන පූර්ව ඔප්පුවක් ලියාපදිංචි කොට තිබේ ද යන්න නිශ්චය වශයෙන් දැන ගැනීම සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ලේඛන පොත් ඔහු විසින් සෝදිසි කළ යුතු ය ; නො හොත් සෝදිසි කරවිය යුතු ය.

ඉඩම්වලට බල පාන ඔප්පුවක් ලියා අත්සන් කිරීමට පෙර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ලේඛන පොත් සෝදිසි කළ යුතු බව.

(ආ) එවැනි යම් පූර්ව ඔප්පුවක් ලියාපදිංචි කොට ඇත් නම් පූර්ව ඔප්පුවේ ලියාපදිංචි කිරීම ඇතුළත් කර ඇති ලේඛන පොත් කාණ්ඩයෙහි අංකය ද පත්ඉරුවේ පිටු අංකය ද ඔප්පුව මුදුනේ ඔහු විසින් තීන්තෙන් ලිවිය යුතු ය :

එසේ වුව ද ගනුදෙනුවේ පාර්ශ්වකරුවන් සෝදිසිය අත් හරින ලෙස ලියවිල්ලකින් නොතාරිස්ට බලය දෙත හොත් සෝදිසි කිරීම අනිවාර්‍ය නොවිය යුතු ය. එහෙත්, කලින් ලියාපදිංචි කිරීමක් ඇතහොත්, ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියාපදිංචි කිරීම පිණිස ඉදිරිපත් කිරීමට පෙර එහි මුදුනේ ඒ පිළිබඳ යොමුව ඔහු විසින් සඳහන් කළ යුතු ය.

(18) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන සෑම ඔප්පුවක ම හෝ සෑම නීත්‍යානුකූල ලේඛනයක ම ඒ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලියා අත්සන් කරන වර්ෂය, මාසය, දිනය සහ ස්ථානය ඔහු විසින් නිවැරදි ලෙස අකුරින් ඇතුළත් කර එයට අත්සන් කළ යුතු ය.

ඔප්පුව ලියා අත් සන් කරන දිනය ඇතුළත් කළ යුතු බව.

(19) ලියා අත්සන් කරන පාර්ශ්වකරු හෝ පාර්ශ්වකරුවන් විසින් අත්සන් කිරීමෙන් පසු යම් ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක යම් මැකීමක්, වෙනස් කිරීමක් හෝ අතර ලිවීමක් ඔහු විසින් නො කළ යුතු ය.

ඔප්පුව ලියා අත් සන් කිරීමෙන් පසු මැකීම්, අතර ලිවීම් ආදිය නො කළ යුතු බව.

(20) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන හෝ පිළිගනු ලබන සෑම ඔප්පුවක් ම හෝ සෑම නීත්‍යනුකූල ලේඛනයක් ම ඔහු විසින් අප්‍රමාදව යථා පරිදි ලියා සහතික කළ යුතු අතර ඒ ලියා සහතික කිරීමට අත්සන් කොට මුද්‍රා තැබිය යුතු ය.

ලියා සහතික කිරීම

තව ද—

(§8, 1947 අංක 48)

(අ) එකී ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය පාර්ශ්වකරුවන් විසින් සහ සාක්ෂිකරුවන් විසින් තමා ඉදිරිපිට දී සහ ඔවුනොවුන් ඉදිරිපිට දී අත්සන් කරන ලද බව ;

(ආ) එකී ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියා අත්සන් කළ හෝ පිළිගත් තැනැත්තා හෝ එයට සාක්ෂි දරු සාක්ෂිකරුවන් (සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් වූ විට තමා දැන සිටියේ කවරකු ද යන්න ඔහු විසින් සඳහන් කළ යුතු ය.) තමා දැන සිටියේ ද යන බව ;

(ඇ) එකී ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලියා අත්සන් කළ හෝ පිළිගනු ලැබූ වර්ෂය, මාසය, දිනය සහ ස්ථානය හා සාක්ෂි දරූ සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචි ස්ථාන ;

(ඈ) ලියා අත්සන් කළ තැනැත්තා විසින් එය කියවා බලන ලද්දේ ද, නැතහොත් එකී නොතාරිස් වන තමා විසින් එකී තැනැත්තාට සාක්ෂිකරුවන් ඉදිරිපිට දී එය කියවා තේරුම් කර දෙන ලද්දේ ද යන බව ;

(ඉ) ඔප්පුවෙහි හෝ නීත්‍යානුකූල ලේඛනයෙහි ප්‍රතිෂ්ඨාව හෝ ප්‍රතිෂ්ඨාවෙහි කොටසක් වශයෙන් යම් මුදලක් තමා ඉදිරිපිට දී ගෙවන ලද්දේ ද නැද්ද යන බව, සහ ගෙවන ලද්දේ නම් ඒ ගෙවීමෙහි නියම ප්‍රමාණය ලංකාවේ මුදලින් ;

(ඊ) එකී ඔප්පුවට හෝ නීත්‍යානුකූල ලේඛනයට සහ එහි අනු පිටපතට අලවන ලද මැලියම් මුද්දර ගණන සහ එහි වටිනාකම හෝ ලාංඡිත මුද්‍රාවෙන් තබන ලද මුද්දරවල වටිනාකම ;

(උ) විශේෂයෙන්, එම ඔප්පුවෙහි හෝ නීත්‍යානුකූල ලේඛනයෙහි කරන ලද මැකීම්, වෙනස් කිරීම් හා අතර ලිවීම්, හා ඒවා කරන ලද්දේ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ඉහත සඳහන් පරිදි කියවා බැලීමට පෙර ද යන බව, සහ එයට තබන ලද අත්සන් වල, එහි අනුක්‍රමික අංකයෙහි සහ එයට අලවන ලද මුද්දර මත ලියූ දෙයෙහි යම් මැකීම්, වෙනස් කිරීම් හා අතර ලිවීම් කරන ලද්දේ නම් ඒවා

යන මේ කරුණු ද ඒ ලියා සහතික කිරීමෙහි සඳහන් කළ යුතු ය.

ලියා සහතික කිරීමේ ආකෘතිය.

(21) එවැනි සෑම ලියා සහතික කිරීමක් දෙවන උපලේඛනයෙහි දැක්වෙන "ඉ" ආකෘතියට සාරානුකූල විය යුතු ය. තව ද ඒ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලියන ලද භාෂාවෙන් පැහැදිලි ලෙස ඔහු විසින් එය අත්සන් කළ යුතු අතර තමාගේ පුරුදු අත්සනෙහි භාෂාව හෝ ආකාරය ඒ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලියන ලද භාෂාවට වෙනස් නම් එම අත්සනින් ද එය අත්සන් කළ යුතු ය. ලියා සහතික කිරීමෙහි සෑම මැකීමක් ම, වෙනස් කිරීමක් ම හෝ අතර ලිවීමක් ම සම්බන්ධයෙන් සිය නමෙහි මුලකුරු යෙදීමෙන් එහි සත්‍ය භාවය නොතාරිස් විසින් සහතික කළ යුතු ය.

නොතාරිස්ගේ බලසීමා පිටත දී හෝ ඔහුට වෘත්තියෙහි යෙදීමට බලය පැවරී ඇති භාෂාව නො වන භාෂාවකින් හෝ ඔප්පුවක් ලියා සහතික නො කළ යුතු බව.

(22) තමාට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති ප්‍රදේශය නො වන යම් ප්‍රදේශයක දී වත් තමාට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති භාෂාව නොවන යම් භාෂාවකින් වත් කිසිම ඔප්පුවක හෝ නීත්‍යානුකූල ලේඛනයක සත්‍ය භාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ඔහු විසින් නොකළ යුතු අතර තමාට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති භාෂාව නොවන භාෂාවකින් පිළියෙළ කරන ලද ඔප්පුවක හෝ නීත්‍යානුකූල ලේඛනයක සත්‍ය භාවය සහතික කිරීම හෝ එය ලියා සහතික කිරීම ද ඔහු විසින් නොකළ යුතු ය.

(23) අන්තිම කැමති පත්‍ර සහ ඌණ පූරණ පත්‍ර ද ඇතුළු ව තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන හෝ පිළිගනු ලබන ලේඛන, ඒවා තමා ඉදිරිපිට ලියා අත්සන් කරන හෝ පිළිගනු ලබන අනුපිළිවෙළට අනුගාමී පූර්ණ සංඛ්‍යා යෙදීමෙන් ඔහු විසින් අංක කළ යුතු ය. මේ ආඥා පනතෙහි 11 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි ඔහු තම ප්‍රදේශය වෙනස් කළහොත් හා අලුත් ප්‍රදේශය පරණ ප්‍රදේශයේ දිස්ත්‍රික්කයට වෙනස් දිස්ත්‍රික්කයක පිහිටා ඇතහොත් අලුත් ප්‍රදේශයේ දී තමා සහතික කරන ලේඛන "1" යන්නෙන් පටන් ගෙන අනුගාමී පිළිවෙළට ඔහු විසින් අංක කළ යුතු ය.

ඔප්පු අංක කළ යුතු බව.

(24) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන හෝ පිළිගනු ලබන සෑම ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක කෙටුම්පතක් හෝ පිට පතක් තමාගේ ප්‍රථම ලේඛනය වශයෙන් ඔහු විසින් පරික්ෂාවෙන් සුරක්ෂිතව තබා ගත යුතු ය. තමාගේ අත්සන සහ මුල් ඔප්පුවේ හෝ මුල් නීත්‍යනුකූල ලේඛනයේ පාර්ශ්වකරුවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අත්සන් ද එයට තබා තිබිය යුතු අතර පහසුවෙන් සොයා ගත හැකි වීමේ කාර්යය සඳහා පහසු සූචියක් සහිත ව ඒවායේ ලේඛන පොතක් ද ඔහු විසින් තබා ගත යුතු ය. එබඳු සෑම ලේඛන පොතක් දෙවන උපලේඛනයෙහි දැක්වෙන "ඊ" ආකෘතියට සාරානුකූල විය යුතු නමුදු අන්තිම කැමති පත්‍ර හා ඌණ පූරණ පත්‍ර සම්බන්ධයෙන් නීත්‍යනුකූල ලේඛනයෙහි අංකය සහ දිනය පමණක් ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු ය.

ප්‍රථම ලේඛනය නොතාරිස් විසින් සුරක්ෂිතව තබා ගත යුතු බව.

(25) එක් නොතාරිස් කෙනකුට වැඩි ගණනක් ඉදිරිපිට යම් ඔප්පුවක් හෝ නීත්‍යනුකූල ලේඛනයක් ලියා අත්සන් කළ හෝ පිළිගනු ලැබූ අවස්ථාවක—

එක් නොතාරිස් කෙනකුට වැඩි ගණනක් ඉදිරිපිට ලියා අත්සන් කරන ඔප්පු.

(§8, 1947 අංක48)

(අ) ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය පළමුවෙන් ලියා සහතික කරන නොතාරිස් (20) වන ව්‍යවස්ථාවෙහි සියලු ම නියමයන් පිළිපැදිය යුතු අතර ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියා සහතික කරන අන් සෑම නොතාරිස් කෙනකු විසින් එකී ව්‍යවස්ථාවෙහි (අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල නියමයන් ද ඔහු විසින් සහතික කරන ලද අත්සන්වල හෝ ඔහුගේ අනුක්‍රමික අංකයෙහි කරන ලද මැකීම්, වෙනස් කිරීම් හා අකර ලිවීම් සම්බන්ධයෙන් (එ) ඡේදයෙහි විධිවිධාන ද පිළිපැදිය යුතු ය ;

(ආ) ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියා සහතික කරන සෑම නොතාරිස් කෙනකු විසින් (23) වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන අනු ව ඒ ඔප්පුව හෝ ලේඛනය අංක කළ යුතු ය ;

(ඇ) ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය පළමුවෙන් ලියා සහතික කරන නොතාරිස් විසින් (24) වන ව්‍යවස්ථාවෙහි සඳහන් කෙටුම් පත හෝ පිට පත තම ප්‍රථම ලේඛනය වශයෙන් සුරක්ෂිත ව තබා ගත යුතු අතර එම ව්‍යවස්ථාවෙහි නියමයන් පිළිපැදිය යුතු ය. ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියා සහතික කරන අන් සෑම නොතාරිස් කෙනකු විසින් ඒ ඔප්පුවෙහි හෝ නීත්‍යනුකූල ලේඛනයෙහි සහතික පිටපතක් සපයා ගත යුතු අතර එම ව්‍යවස්ථාවෙහි කාර්‍යයන් සඳහා එය ඔහුගේ ප්‍රථම ලේඛනය ලෙස සැලකිය යුතු ය ; තව ද

(ඈ) ඒ ඔප්පුව සහතික කරන සෑම නොතාරිස් කෙනකු විසින් අතිරේක වශයෙන් 31 වන වගන්තියෙහි සෙසු විධිවිධාන ද හැකි තාක් දුරට පිළිපැදිය යුතු ය.

ඔප්පුවල දෙවන පිටපත් ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු බව.

(26) (අ) ඔහු විසින් සෑම මාසයකම පසළොස් වන දින හෝ එදිනට පෙර, පහත සඳහන් ලේඛන, එනම් පෙරාතුව වූ මාසය තුළ දී ඔහු ඉදිරිපිට ලියා අත්සන් කරන ලද හෝ පිළිගනු ලැබූ හෝ ඔහු විසින් ලියා සහතික කරන ලද (අන්තිම කැමති පත්‍ර හා ඌණ පූරණ පත්‍ර හැර) සෑම ඔප්පුවක ම හෝ සෑම නීත්‍යානුකූල ලේඛනයක ම අනුපිටපත, අනුපිටපතක් සහිත වූ ද තමා විසින් අත්සන් කරනු ලැබූ ද දෙවන උපලේඛනයෙහි දැක්වෙන "ඊ" ආකෘතියට සාරානුකූල වූ ද ඒ සියලුම ලේඛනවල නාමාවලියක් සමග තමා පදිංචි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දිය යුතු ය ; නොහොත් එදින හෝ එදිනට පෙර ඔහුට ලැබෙන ලෙස යැවිය යුතු ය :

(§4, 1943 අංක 59)

එසේ වුව ද අන්තිම කැමති පත්‍ර සහ ඌණ පූරණ පත්‍ර සම්බන්ධයෙන් ලේඛනයෙහි අංකය සහ දිනය පමණක් ඒ නාමාවලියෙහි ඇතුළත් කළ යුතු ය.

(ආ) යම් මාසයක යම් නොතාරිස් කෙනකු ඉදිරිපිට කිසිම ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කර නැතහොත් ඒ නොතාරිස් ලංකාවෙන් බැහැර ගොස් සිටියි නම් මිස ඔහු විසින් ඒ මාසය සඳහා ඊළඟ මාසයේ පසළොස් වන දින හෝ එදිනට පෙර හිස් නාමාවලියක් යැවිය යුතු ය.

(§4, 1943 අංක 7)

(ඇ) (i) පාර්ශ්වකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් ලියා අත්සන් කිරීමට ඇති හෝ පිළිගැනීමට ඇති යම් ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් යම් මාසයක දී, අවස්ථාවෝචිත පරිදි ඒ පාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශ්ව කරුවෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් අත්සන් කරන ලද අවස්ථාවක, ඒ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ඒ සියලු ම පාර්ශ්වකරුවන් විසින් අත්සන් කර නැති නමුදු එය නොතකා ඒ නොතාරිස් විසින් ඒ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය (අ) ඡේදය යටතේ භාරදීමට හෝ යැවීමට නියමිත නාමාවලියට ඇතුළත් කළ යුතු ය. තව ද පුද්ගලික ව හෝ ලියාපදිංචි කළ තැපැලෙන් තමා වෙත භාරදුන්නා වූ ද තමා පදිංචි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් අත්සන් කළා වූ ද ලිඛිත දැන්වීමකින් ඉල්ලා සිටියහොත් ඒ ඔප්පුවේ හෝ නීත්‍යානුකූල ලේඛනයේ අනුපිටපත පරීක්ෂා කිරීම පිණිස ඒ දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි දිනයෙහි හෝ එදිනට පෙර ඔහු විසින් රෙජිස්ට්‍රාර්ගේ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(§4, 1943 අංක 7)

(ii) එවැනි යම් ඔප්පුවක හෝ නීත්‍යනුකූල ලේඛනයක පාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශ්වයක් විසින් එය පළමුවෙන් අත්සන් කළ දින සිට මාස තුනක කාලයක් ගතවීමට පෙර එහි සියලුම පාර්ශ්වකරුවන් විසින් එය අත්සන් කරනු නො ලැබූ අවස්ථාවක, පුද්ගලිකව හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් තමා වෙත භාර දුන්නාවූ ද තමා පදිංචි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් අත්සන් කළා වූ ද ලිඛිත දැන්වීමකින් ඉල්ලා සිටියහොත් ඒ ඔප්පුවේ හෝ නීත්‍යනුකූල ලේඛනයේ අනුපිටපත නොතාරිස් විසින් රෙජිස්ට්‍රාර් වෙත භාර දිය යුතු ය ; නොහොත් යැවිය යුතු ය. තව ද, එවැනි යම් අනුපිටපතක් එසේ භාරදෙන ලද හෝ යවන ලද අවස්ථාවක, තමා ඉල්ලා සිටි විට, ඒ භාරදීම හෝ යැවීම කළ දිනයෙන් පසුව පැමිණෙන අවුරුදු දෙකෙහි කාලය තුළ කවර වේලාවක වුවත්, ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය සම්පූර්ණ කිරීමේ කාර්‍ය්‍ය සඳහා ඒ දෙවන පිටපත ආපසු ලැබීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය.

(27) ඔහු විසින් සෑම බදාදා ම හෝ ඊට පෙර, එදිනට කලින් වූ සෙනසුරාදට අවසන් වූ සතියෙහි දී නොතාරිස් කෙනකු වශයෙන් තමා විසින් කරන ලද වැඩ පිළිබඳ ලේඛනයක්, තමා පදිංචි දිස්ත්‍රික්කයෙහි ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දිය යුතු ය ; නොහොත් එදින හෝ එදිනට පෙර ඔහුට ලැබෙන ලෙස යැවිය යුතු ය. එවැනි සෑම ලේඛනයක් දෙවන උපලේඛනයෙහි දැක්වෙන "උ" ආකෘතියට සාරානුකූල විය යුතු ය : *කරන ලද වැඩ පිළිබඳ සතිපතා ලේඛනයක් ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු බව.*

එසේ වුව ද අන්තිම කැමති පත්‍රයක් හෝ ඌණ පූරණ පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට නීත්‍යනුකූල ලේඛනය ලියා අත්සන් කළ හෝ පිළිගත් තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නාම ඇතුළත් නො කළ යුතු ය.

(28) අන්තිම කැමති පත්‍රයක් හෝ ඌණ පූරණ පත්‍රයක් නො වන යම් ඔප්පුවක් හෝ නීත්‍යනුකූල ලේඛනයක් පාර්ශ්වකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් එක් නොතාරිස් කෙනකුට වැඩි ගණනක් ඉදිරිපිට ලියා අත්සන් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ අවස්ථාවක, ඒ ඔප්පුවේ හෝ නීත්‍යනුකූල ලේඛනයේ අනුපිටපත ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය පළමුවෙන් ලියා සහතික කළ නොතාරිස් විසින් තමා පදිංචි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාරදිය යුතු ය ; නොහොත් යැවිය යුතු ය ; ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය ලියා අත්සන් කිරීමෙහි ලා යෙදුණු අනිත් නොතාරිස් හෝ නොතාරිස්වරුන් විසින් එහි යම් අනුපිටපතක් ඒ රෙජිස්ට්‍රාර් වෙත භාරදීම හෝ යැවීම අවශ්‍ය නො විය යුතු ය. *වෙන වෙන නොතාරිස්වරුන් ඉදිරිපිට ලියා අත්සන් කරන ඔප්පු ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම.* *(§8, 1947 අංක 48)*

(29) අන්තිම කැමති පත්‍රයක් හෝ ඌණ පූරණ පත්‍රයක් නො වන ඔප්පුවක් හෝ නීත්‍යනුකූල ලේඛයනක් යම් නොතාරිස් කෙනකු ඉදිරිපිට අත්සන් කරනු ලැබ ඔහු විසින් ලියා සහතික කරන ලද ද, ඒ නොතාරිස් පදිංචි දිස්ත්‍රික්කය නො වන දිස්ත්‍රික්කයක පිහිටි ඉඩමක් කෙරෙහි එය බලපායි නම් ඒ නොතාරිස් විසින්, හෝ ඒ ඔප්පුව හෝ නීත්‍යනුකූල ලේඛනය නොතාරිස්වරු දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් ලියා සහතික කරන ලද අවස්ථාවක දී නම් ඒ ඔප්පුවෙහි හෝ නීත්‍යනුකූල ලේඛනයෙහි අනුපිටපත රෙජිස්ට්‍රාර් ජනරාල් *නොතාරිස් පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත ඉඩම්වලට බලපාන ඔප්පු ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම.*

වෙත යැවීමේ යුතුකම පැවරී ඇති නොතාරිස් විසින්, එය ලියා අත්සන් කළ මාසයෙන් පසුව එන ඊළඟ මාසයේ පස ළොස් වන දිනයෙහි හෝ එදිනට පෙර, ඒ ඔප්පුවේ හෝ නීත්‍යානුකූල ලේඛනයේ තමා විසින් නිවැරදි බවට සහතික කරන ලද පිටපතක්, ඒ අන්තිමට සඳහන් කළ දිස්ත්‍රික්කයේ ඉඩම්වලට අදාළ සියලුම ඔප්පුවල හෝ නීත්‍යානුකූල ලේඛනවල තමා විසින් අත්සන් කරන ලද්ද වූ ද දෙවන උපලේඛනයේ ''ඊ'' ආකෘතියෙහි වූ ද අනුපිටපතක් සහිත වූ ද නාමාවලියකුත් සමග (ඉහත කී පරිදි අනුපිටපත යැවීමට අමතරව) ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාරදිය යුතු ය; නොහොත් යැවිය යුතු ය.

ඇටෝර්නි බලකරුවකු විසින් ලියා අත්සන් කරන ඔප්පු පිළිබඳ කාර්ය පටිපාටිය.

(30) ඇටෝර්නි බලකරුවකුගේ මාර්ගයෙන් තමා ඉදිරිපිට ලියා අත්සන් කරන ලද ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් තමා විසින් සහතික කරනු ලැබේ නම් ඇටෝර්නි බලපත්‍රයේ සැබෑ පිටපතක් තම ප්‍රථම ලේඛනය සමග ඔහු විසින් සුරක්ෂිත ව තබා ගත යුතු අතර එහි එවැනි ම පිටපතක් අනුපිටපත ද සමග ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

කාර්යාලය වෙනස් කිරීමට හෝ වෘත්තියෙහි යෙදීම නැවැත්වීමට අදහස් කිරීම දිස්ත්‍රික් විනිශ්චයකරු වෙත දන්විය යුතු බව.

(31) තම කාර්යාලය වෙනස් කිරීමට හෝ වෘත්තියෙහි යෙදීම නතර කිරීමට ඔහු අදහස් කරතහොත් තමාට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් විනිශ්චයකරු වෙත මෙන් ම රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද ඒ පිළිබඳ මාසයකට කලින් වූ දැන්වීමක් ඔහු විසින් කළ යුතු අතර ඒ බවට තමා විසින් අත්සන් කරන ලද ලිඛිත දැන්වීමක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් උසාවියෙහි පිට දෙර හෝ බිත්ති මත ඇලවිය යුතු ය.

කාර්යාල වෙනස් කළ විට දැන්වීම.

(32) ඔහු ඔහුගේ කාර්යාලය වෙනස් කළ කවර විටක වුව ද තම අලුත් කායඨාලය පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත සහ දිස්ත්‍රික් විනිශ්චයකරු වෙත ද එම පරිපාලන දිස්ත්‍රික්කයෙහි දිසාපති වෙත ද ඒ වෙනස් කිරීම අප්‍රමාදව ඔහු විසින් දැන්විය යුතු ය.

හැකි සෑම විටක නිශ්චල දේපළක හිමිකම් ඔප්පුව ලබාගත යුතු බව.

(33) නොතාරිස් කෙනකු ඉදිරිපිට යම් නිශ්චල දේපළක් හිමිකර දීමේ ඔප්පුවක් ලියා අත්සන් කළ විට හෝ පිළිගනු ලැබූ විට ඒ දේපළෙහි හිමිකම් ඔප්පුවක් ඇතහොත් එය ලබා ගැනීමට හැකි සෑම උත්සාහ යක් ම ඔහු විසින් දැරිය යුතු අතර තමා ඉදිරිපිට ලියා අත්සන් කළ ඔප්පුවේ අංකය සහ දිනය ද ගනුදෙනුවේ ස්වභාවය ද ප්‍රකාශ වන පිටසහනක් ඒ මත යොදා එයට ඔහු අත්සන් කළ යුතු ය.

ඉල්ලා සිටි කවර විටක වුවත් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත පහද දීම සැපයීමට නොතාරිස් බැඳී සිටින බව.

(34) නොතාරිස් වශයෙන් ඔහුගේ යුතුකම් ඉටු කිරීමේ දී කරන ලද බව සොයා ගනු ලැබූ නොහොත් සොයා ගන්නා ලදැයි කියනු ලබන හා නීතිය කඩ කිරීමක් ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්ට පෙනී යන යම් අක්‍රමිකතාවක්, වරදක් හෝ අකෘත්‍යයක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නියෝගය පිට ඉඩම් කොමසාරිස් නියම කළ විට ඔහු විසින් ලියවිල්ලකින් පහදදීමක් කළ යුතු ය. එහෙත් ඒ අක්‍රමිකතාවය, වරද හෝ අකෘතය සිදු වූ දිනයෙන් මාස විසි හතරක් ගතවීමෙන් පසු, කවර කරුණක දී වත්, එවැනි පහද දීමක් නො ඉල්විය යුතු ය.

(35) ඔහු විසින් "ප්‍රසිද්ධ නොතාරිස්" යන්නත් සමග ඔහුගේ නම පැහැදිලි අකුරෙන් ඉංග්‍රීසි භාෂාවෙන් හා තමාට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති භාෂාවෙනුත් තම කාර්යාලයෙහි හෝ කටයුතු කරන ස්ථානයෙහි දෙරටුවේ හෝ ඔහුට කාර්යාල හෝ කටයුතු කරන ස්ථාන එකකට වැඩි ගණනක් ඇතහොත් ඒ එක් එක් ස්ථානයෙහි දෙරටුවේ හෝ ඊට නුදුරු ප්‍රකට ස්ථානයක ඇඳ හෝ සවිකර තැබිය යුතු ය.

කාර්යාලයේ දෙරටුවේ නම සවි කොට තැබිය යුතු බව.

(36) පහත දැක්වෙන අතිරේක රීති තරයේ පිළිපැදීම සහ ඒවාට අනුකූල ව ක්‍රියා කිරීම නීතිඥයකු නො වන සෑම නොතාරිස් කෙනකුගේ ම යුතුකම විය යුතු ය. එනම් :—

නීතිඥයකු නොවන නොතාරිස් කෙනකුට අදාළ විය යුතු අතිරේක රීති.

(අ) ඇමතිවරයාගේ අනුමතියට යටත් ව තමා විසින් තෝරා ගනු ලැබිය හැකි ස්ථානවල ඔහු පදිංචි විය යුතු ය ; ධුරය දැරිය යුතු ය.

නොතාරිස්, අනුමත කළ ස්ථානයෙහි ඔහුගේ ධුරය දැරිය යුතු බව.

(ආ) තම කාර්යාලයෙහි හෝ තමාට කාර්යාල එකකට වැඩි ගණනක් ඇතහොත් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමත කරනු ලබන කාර්යාලයක ඔහු තම ලේඛන මිටි තබා ගත යුතු අතර රෙජිස්ට්‍රාර් ජනරාල්ට ද දිසාපතිට ද තමා පදිංචි දිස්ත්‍රික්කයෙහි හෝ කොට්ඨාශයෙහි දිස්ත්‍රික් විනිශ්චයකරුට හෝ රික්වෙස්ට් විනිශ්චයකරුට ද යුක්ති සහගත සියලු කාලවේලාවල එම කාර්යාලයෙහි දී ඒ ලේඛන මිටි පරීක්ෂා කර බැලීමට අවසර දිය යුතු ය.

ලේඛන මිටි නොතාරිස්ගේ කාර්යාලයෙහි තැබිය යුතු බව.

(§8, 1947 අංක48)

(ඇ) අසනීපයක් නිසා හෝ වෙනත් සෑහෙන හේතුවක් නිසා වැලැක්වුණහොත් මිස සඳුදා සහ බ්‍රහස්පතින්ද දිනවල හෝ ඒ දිනය රජයේ නිවාඩු දිනයක් වුවහොත් ඊට පසු දිනයෙහි පූර්ව භාග 10 සිට අපරභාග 1 දක්වා අතර කාලය තුළ, සිය ලේඛන මිටි තබන කාර්යාලයෙහි ඔහු සිටිය යුතු ය. ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් සඳහා උපදෙස් ලබා ගැනීම හෝ එයට අත්සන් ගැනීම, උපදෙස් හෝ අත්සන ලබාගැනීමට ඇත්තේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා මරණාසන්නව සිටිති යි විශ්වාස කරතහොත් හැර කාර්යාලයට පැමිණ නො සිටීමට සෑහෙන හේතුවක් නො විය යුතු ය.

නොතාරිස් කවර වේලාවක සිය කාර්යාලයෙහි සිටීමට බැඳී සිටීද යන වග.

(ඈ) (ආ) රීතියෙහි නම් සඳහන් නිලධරයන්ගෙන් යමකු විසින් නියම කරනු ලැබූ විට ළඟම පිහිටි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී, කච්චේරියේ දී, උසාවියේ දී, තානායමේ දී හෝ වෙනත් ප්‍රසිද්ධ ස්ථානයක දී, ඒ සඳහා තමා වෙත භාර කරනු ලබන දැන්වීමක නිශ්චිත ව සඳහන් ලේඛන, සියලු යුක්ති සහගත කාලවේලාවල දී ඔහු විසින් ඒ නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඔහුගේ කාර්යාලයෙහි හෝ වාසස්ථානයෙහි තබා යන ලද්දේ නම් දැන්වීම නිසි පරිදි ඔහුට භාර කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

නියම කළ විට නොතාරිස් විසින් ලේඛන ඉදිරිපත් කළ යුතු බව.

(§8, 1947 අංක48)

**විශේෂ අවස්ථාවල දී 31 වන වගන්ති යෙහි රීති අදළවීම පිළිබඳ විධිවිධාන.**
**(§5, 1943 අංක 7)**
**(§9, 1947 අංක48)**

32. (1) 31 වන වගන්තියෙහි දක්වෙන (20), (23), (24), (25) සහ (26) යන රීතිවල සහ මායිම් ප්‍රකාශය පිළිබඳ වූ (16) වන රීතියෙහි විධිවිධාන පහත දක්වෙන ඔප්පු හෝ නිත්‍යානුකූල ලේඛන අතුරින් කිසිවකට අදළ නො විය යුතු ය :—

(I) ලංකාවෙන් පිටත දී පාවිච්චි කිරීම සඳහා වූ ඇටෝර්නි බලපත්‍රයක් ;

(II) ලංකාවේ පිහිටා නොමැති දේපළ කෙරෙහි පමණක් බලපාන ඔප්පුවක් ;

(III) යම් ආණ්ඩුවක ස්කන්ධ හිමිකර දීමක් ;

(IV) ලියාපදිංචි කළ කාර්යාලයක් ලංකාවෙහි නොමැති යම් සමාගමක හෝ නීතිගත සංස්ථාවක ස්කන්ධ, කොටස් හෝ ණය පත්‍ර පවරා දීමක් ;

(V) දීර්ඝ කළ විරෝධයක් නොවන, නැවත නිලධරයකු විසින් කරනු ලබන විරෝධතා දන්වීමක්.

(2) පාර්ශ්වකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් ලියා අත්සන් කිරීමට ඇති යම් ඔප්පුවක් සම්බන්ධයෙන් වූ විට, අවස්ථාවෝචිත පරිදි ඒ දෙදෙනා ම නැතහොත් ඒ සියලු දෙනා ම විසින් එක ම වේලාවේ දී හා ස්ථානයේ දී ඒ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය අත්සන් නො කරන අවස්ථාවක දී—

(i) පාර්ශ්වකරුවකු විසින් හෝ එකම වේලාවේ දී හා ස්ථානයේ දී පාර්ශ්වකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් පළමු වෙන් එය අත්සන් කළ වේලාවෙහි ඒ ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලියා අත්සන් කරනු ලැබූ ලෙස හෝ පිළිගනු ලැබූ ලෙස 31 වන වගන්තියෙහි දක්වෙන (6), (7), (23) හා (25) යන රීති අදළ කිරීමේ කාර්යයන් සඳහා සැලකිය යුතු ය ;

(§9, 1947 අංක48)

(ii) පාර්ශ්වකරුවකු විසින් හෝ එක ම වේලාවේ දී හා ස්ථානයේ දී පාර්ශ්වකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් අත්සන් කළ කවර වේලාවක වුවත් එම ඔප්පුව හෝ නීත්‍යානුකූල ලේඛනය ලියා අත්සන් කළ ලෙස හෝ පිළිගනු ලැබූ ලෙස 31 වන වගන්ති යෙහි දක්වෙන (18) හා (20) යන රීති අදළ කිරීමේ කාර්යයන් සඳහා සැලකිය යුතු ය ; තව ද

(iii) පාර්ශ්වකරුවකු විසින් හෝ එක ම වේලාවේ දී සහ ස්ථානයේ දී පාර්ශ්වකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් ඔප්පුව හෝ නිත්‍යානුකූල ලේඛනය අත්සන් කිරීමෙන් පසු 31 වන වගන් තියෙහි දක්වෙන (19) වන රීතියෙහි විධිවිධාන අදළ විය යුතු ය.

ආකාරය පිළිබඳ යම් කරුණක දී 31 වන වගන්තිය අනුව ක්‍රියා නො කිරීම නිසා නිත්‍යා නුකූල ලේඛන අවලංගු නො විය යුතු බව.
(§5, 1943 අංක 7)

33. ආකාරය පිළිබඳ යම් කරුණක් සම්බන්ධයෙන් 31 වන වගන්තියෙහි දක්වෙන යම් රීතියක යම් විධිවිධානයක් අනුව ක්‍රියා කිරීම යම් නොතාරිස් කෙනකු පැහැර හැරීමේ හේතුවෙන් පමණක් කිසිම නිත්‍යානුකූල ලේඛනයක් අවලංගු වන ලෙස නො සැලකිය යුතු ය.

එසේ වුව ද අන් කිසි ලිඛිත නීතියක විධිවිධාන අනුව ක්‍රියා නො කිරීම නිසා අවලංගු විය හැකි යම් නිත්‍යානුකූල ලේඛනයක් වලංගු කරවන ලෙස මෙහි මෙයට පෙර ඇතුළත් වූ කිසිවක් නො සැලකිය යුතු ය.

34. (I) යම් නොතාරිස් කෙනෙක් 31 වන වගන්තියෙහි දැක්වෙන රීතිවලින් කිසිවක් හෝ 36 වන වගන්තියෙහි විධිවිධාන අනුව පනවන ලද, අනුමත කරන ලද හා ප්‍රසිඩ කරන ලද, තමා බැඳී සිටින, යම් ව්‍යවස්ථාවක් කඩ කෙරෙන පරිදි ක්‍රියා කරයි නම් හෝ නො සලකා හරියි නම් හෝ පිළිපැදීම පැහැර හරියි නම් ඔහු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ හේතුවෙන් ඔහුට දැරීමට සිදු විය හැකි යම් සිවිල් වගකීමකට අමතර ව රුපියල් දෙසියයකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය :

31 වන වගන්තියෙහි රීති කඩ කිරීම සඳහා දණ්ඩනය.

(§6, 1943 අංක 7)

(§13,1951 අංක 6)

එසේ වුව ද යම් නොතාරිස් කෙනෙකු 31 වන වගන්තියෙහි දැක්වෙන (26) වන රීතියෙහි විධිවිධාන කඩ කෙරෙන පරිදි ක්‍රියා කරන අවස්ථාවක හෝ ඒවා නොසලකා හරින හෝ පිළිපැදීම පැහැර හරින අවස්ථාවක, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඒ කාර්යය සඳහා නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි වැඩිදුරටත් වූ කාලයක් ඇතුළත එකී රීතියෙහි නියමයන් අනුව ක්‍රියා කරන ලෙස, ඒ නොතාරිස් වෙත පුද්ගලිකව භාර කරනු ලබන හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඔහුට නියම කළ හැකි ය. ඒ දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් නොතාරිස් කෙනෙකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) නොතාරිස් පදිංචි ව සිටින දිස්ත්‍රික්කයෙහි ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ඇතැම් ලේඛන භාරදීමට අදළ 31 වන වගන්තියෙහි දැක්වෙන (26) වන රීතියෙහි නියමයන් අනුව ක්‍රියා කරන ලෙස ඉල්ලන දැන්වීමක නියමයන් අනුව ක්‍රියා නො කිරීම සම්බන්ධයෙන් මේ වගන්තියේ (1) වන උප වගන්තියෙහි අතුරු විධානය යටතේ යම් නොතාරිස් කෙනකු වරදකරු කරනු ලැබුවේ නම් හා එසේ වරදකරු කරනු ලැබීමෙන් සතියක් ඇතුළත දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ලේඛන එම රෙජිස්ට්‍රාර් වෙත භාරදීම නොතාරිස් විසින් පැහැර හරින ලද්දේ නම් ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට ඇමතිවරයා විසින් සුදුසු ය යි සලකන කාලයක් සඳහා ඒ නොතාරිස් ඔහුගේ නොතාරිස් ධූරයෙන් අත් හිටුවිය හැකි ය.

(§13, 1951 අංක 6)

35. (I) 28(3) වන වගන්තියෙහි, 30 වන වගන්තියෙහි, 34 වන වගන්තියෙහි, 37 වන වගන්තියෙහි හෝ 41 වන වගන්තියෙහි සඳහන් යම් වරදක් යම් නොතාරිස් කෙනෙකු විසින් කර ඇතැයි විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්ට යුක්ති සහගත හේතු තිබෙන යම් අවස්ථාවක දී රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් සුදුසු ය යි සලකතහොත් ඒ නොතාරිස්ට විරුද්ධව අපරාධ නීතිකෘත්‍ය පවරනු වෙනුවට යෝග්‍ය ය යි තමා විසින් සැලකිය හැකි යම් මුදල් ගණනක් ඒ වරද සමථයකට පත් කිරීම් වශයෙන් නොතාරිස්ගෙන් පිළිගත හැකි ය ; තව ද කරන ලදැයි කියනු ලබන යම් වරදක් සමථයකට පත් කිරීම් වශයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් යම් නොතාරිස් කෙනෙකුගෙන් යම් මුදල් ගණනක් පිළිගනු ලැබූ අවස්ථාවක—

වැරදි සමථයට පත් කිරීමට ඇති බලය.

(§7, 1943 අංක 7)

(§14, 1951 අංක 6)

(I) ඒ වරද සම්බන්ධයෙන් අපරාධ නීතිකෘත්‍ය පැවරීම හෝ පවරා ඇතහොත් තවදුරටත් පවත්වා ගෙන යෑම නො කළ යුතු ය. තව ද

(§14, 1951 අංක 6)

(II) නිශ්චල දේපළ යටත් කොට බැඳ තැබීමෙන් හෝ චංචල දේපළ තැන්පත් කිරීමෙන් නොතාරිස් කෙනකු වෙනුවෙන් ඇප තබා ඇති යම් තැනැත්තකු හෝ ඇපකරු වශයෙන් බැඳුනු යම් ඇපකාර සමාගමක් 12 වන වගන්තිය යටතේ දරන්නා වූ යම් වගකීමකින් නිදහස් කිරීමේ බලපෑම ඒ සමර්ථයට පත් කිරීමෙන් ඇති නො විය යුතු ය.

(§7, 1943 අංක 7)

(2) යම් වරදක් සමර්ථයකට පත් කිරීම් වශයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් භාර ගනු ලබන සියලු මුදල් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ය.

රීති පැනවීමට ඇති බලය.
(§15, 1951 අංක 6)

36. (1) නීතිඥ වරුන් නොවන නොතාරිස්වරුන්ගේ නොතාරිස් කටයුතු පිළිබඳ යුතුකම් ඉටුකිරීමෙහි ලා ඔවුන්ගේ පැවැත්ම සම්බන්ධයෙන් ඇමති වරයා විසින් රීති පනවනු ලැබිය හැකිය.

(2) මේ වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ පනවනු ලබන කිසිම රීතියක් ඒ රීතිය උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තුරු සහ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් එය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන තුරු බල නොපැවැත්විය යුතුය.

(3) මේ වගන්තියෙහි ඉහත දැක්වුන විධිවිධානවලට අනුකූලව පනවන ලද, අනුමත කරන ලද හා ප්‍රසිද්ධ කරන ලද සෑම රීතියක් මෙහි ලා පනවනු ලැබ ඇත්තාක් මෙන් වලංගුව බල පැවත්විය යුතුය.

ඔප්පු ලියාපදිංචි කිරීමෙහි ලා නොතාරිස් උද්‍යෝගය දැක්විය යුතු බව.

37. තමා විසින් පිළියෙල කරන ලද හෝ ලියා සහතික කරන ලද යම් ඔප්පුවක් ලියා පදිංචි කරන ලෙස උපදෙස් ද ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වියදම් පියවීමට ප්‍රමාණවත් මුදලක් ද යම් නොතාරිස් කෙනෙකු වෙත ලැබී ඇත්නා වූ හා එවැනි අවස්ථාවක දී ඒ ලියාපදිංචි කිරීම සිදු කරවීම සම්බන්ධ යෙන් නිසි උද්‍යෝගය දැක්වීමට ඔහු අපොහොසත් වූ කවර විටෙක වුව ද ඔහු වරදකට වරද කරු වියයුතු අතර වරදකරු කරනු ලැබූ විට ඔහුගේ ඒ පැහැර හැරීමේ හේතුවෙන් ඔහුට දැරීමට සිදු විය හැකි යම් සිවිල් වගකීමකට අමතරව රුපියල් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

නියම ප්‍රතිෂ්ඨාව නිශ්චිතව දැනගැනීමට නොතාරිස් උත්සාහ කළ යුතු බව.

38. (1) යම් ඔප්පුවක් ලියා අත්සන් කිරීම සඳහා වූ නියම සහ සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව නිශ්චය වශයෙන් දැනගැනීමට උත්සාහ කිරීම ද ඒ ඔප්පුවෙහි එය ඇතුළත් කර දැක්වීම ද සෑම නොතාරිස් කෙනෙකුගේ යුතුකම විය යුතුය.

(2) එවැනි ඔප්පුවක් සඳහා නියම වශයෙන් හෝ අනියම් වශයෙන් ගෙවන ලද හෝ ලබාගන්නා ලද හෝ ගෙවීමට හෝ ලබාගැනීමට එකඟ වූ සම්පූර්ණ සහ නියම ප්‍රතිෂ්ඨාව හෝ මුදල හෝ එහි නියම වටිනාකම නොවන අන් කිසිවක් යම් නොතාරිස් කෙනෙකු විසින් දැන දැන ම හා ඕනෑකමින් ම ඒ ඔප්පුවෙහි හෝ ඔප්පුව මත ඇතුළත් කරතහොත් හෝ දක්වතොත් හෝ පිළිවෙළින් එසේ කිරීමට අනුබල දෙතහොත් ඔහු වරදකට වරදකරු විය යුතු අතර ඒ හේතුවෙන් ඔහුට දැරීමට සිදුවිය හැකි යම් සිවිල් වගකීමකට අමතරව ඒ සෑම වරදක් සම්බන්ධයෙන් රුපියල් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

නොතාරිස් වංචනිකව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

39. යම් නොතාරිස් කෙනෙකු විසින්,—

(අ) යම් වංචනික ඔප්පුවක් එය වංචනික ඔප්පුවක් බව දැන දැන ම ලියා අත්සන් කරත හොත් ; හෝ

(ආ) යම් තැනැත්තකුට හානි කිරීමේ හා වංචා කිරීමේ අභිප්‍රායෙන් දැන දැන ම හා ඕනෑකමින් ම, යම් ඔප්පුවක හෝ කවර ආකාරයේ වූ හෝ යම් නීතියානුකූල ලේඛනයක එහි ඇතුළත් කර නොතිබිය යුතු වූ යම් වචනයක්, අකුරක්, ඉලක්කමක්, කරුණක් හෝ දෙයක් ඇතුළත් කරතහොත් හෝ ඇතුළත් කර තිබිය යුතු වූ යම් වචනයක්, අකුරක්, ඉලක්කමක්, කරුණක් හෝ දෙයක් ඇතුළත් කිරීම නොකර හරිතහොත් ; හෝ

(ඇ) තමා සහතික කළ අත්සන හෝ සලකුණ හිමි තැනැත්තා හා සාක්ෂි දරන තැනැත්තන් ඔප්පුව ලියා අත්සන් කරන හෝ පිළිගනු ලබන වේලාවෙහි තමා ඉදිරිපිට පුද්ගලිකව පැමිණ නො සිටිය දී යම් ඔප්පුවක් ලියා සහතික කරතහොත් ; හෝ (§10,1947 අංක 48)

(ඈ) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ යම් ඔප්පුවක් ලියා අත්සන් කිරීමෙහි ලා දැන දැන ම හා ඕනෑකමින් ම යම් අසත්‍ය ප්‍රකාශයක් කරතහොත් ; හෝ

(ඉ) තමා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලබන හෝ පිළිගනු ලබන යම් ඔප්පුවක යම් පාර්ශ්වකරුවකුට එහි අන්තර්ගත කරුණු හෝ එහි බලපෑම ඕනෑකමින් ම, ද්වේශ සහගතව, හෝ වංචනිකව වරදවා ප්‍රකාශ කරතහොත් හෝ වැරදි ලෙස දක්වතහොත් ; හෝ

(ඊ) තම ධූරයෙහි කටයුතු කිරීමෙහි දී යම් දෙයක් කිරීමක් හෝ නොකර හැරීමක් වූ ඕනෑකමින් ම කළ අන් කිසි ක්‍රියාවකින් යම් වංචාවක් සිදු කළහොත් හෝ සිදු කිරීමට තැත් කළහොත් ; හෝ

(උ) තමාගේ බාරයෙහි හෝ ආරක්ෂාවෙහි පැවැති හෝ සුරක්ෂිතව තබා ගැනීමට තමා බැඳී සිටි යම් ඔප්පුවක් හෝ යම් ඔප්පුවක යම් කොටුම්පතක්, සටහනක් හෝ පිටපතක් ඕනෑකමින් ම, ද්වේශ සහගතව, හෝ වංචනිකව විරූප කරතහොත්, විකෘති කරතහොත්, එයට හානි කරතහොත්, එය විනාශ කරතහොත් හෝ නැති කරතහොත්

එවැනි සෑම නොතාරිස් කෙනකු ඒ අවස්ථා අතුරින් කවර අවස්ථාවක වුවත් වරදකට වරදකරු විය යුතු අතර ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට බරපතල වැඩ නැතිව හෝ ඇතිව අවුරුදු පහකට නො වැඩි යම් කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

40. (1) නොතාරිස්වරුන් විසින් තුන්වන උපලේඛනයෙහි ප්‍රකාශිත ව දැක්වෙන ස්වකීය ධූරයෙහි යුතුකම් ඉටු කිරීම සඳහා නීත්‍යනුකූලව ඒ උප ලේඛනයෙහි නිශ්චිතව දැක්වෙන විවිධ ගාස්තු ඉල්ලා ලබා ගත යුතු ය ; එමෙන් ම ඔවුන් විසින් එසේ කළ හැකි ය : නොතාරිස්වරුන්ගේ ගාස්තු.

එසේ වුව ද—

(අ) තුන්වන උපලේඛනයෙහි නියමිත ගාස්තුවට වැඩි හෝ අඩු ගාස්තුවකට එකඟවීමට යම් නොතාරිස් කෙනෙකුට හෝ සේවා දායකයකුට පුළුවන් විය යුතු ය ;

(අ) ලියවිල්ලෙන් කර ගතහොත් හා පාර්ශ්වකරුවන් විසින් අත්සන් කරනු ලැබුවහොත් මිස ඒ එකඟවීම උසාවියක දී ක්‍රියාත්මක කළ නොහැකි විය යුතු ය.

(2) නොතාරිස්වරු විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු පිළිබඳ ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවලින් වූ තුන්වන උපලේඛනයේ නිවැරදි පිටපතක් සෑම දිස්ත්‍රික් උසාවියක හා රික්වෙස්ට් උසාවියක ද සෑම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයක හා කච්චේරියක ද සෑම නොතාරිස් කෙනෙකු විසින් ඔහුගේ එක් එක් කාර්යාලයෙහි ද ප්‍රකට ස්ථානයක සියලු කාලවේලාවල ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

(3) සේවා දායකයා විසින් ඉල්ලා සිටියහොත් කවර නොතාරිස් කෙනෙකු විසින් වුව ද තමාට ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල් සඳහා ලිඛිත ලදුපතක් දිය යුතු ය.

නොතාරිස් මිය ගියා වූ ආදී අවස්ථා වල ඔහුගේ ලේඛ නා රෙජිස්ට්‍රාර් වෙත භාරදීම.

41. (1) යම් තැනැත්තකු නොතාරිස් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ඔහු නොතාරිස් ධූරයෙහි ක්‍රියා කිරීම අවසාන වුවහොත්, හෝ එවැනි යම් නොතාරිස් කෙනෙකු මිය ගිය අවස්ථාවක, ඔහුගේ උරුමක්කරුවන්, පොල්මෑකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ වෙනත් යම් තැනැත්තන් ගෙන් කිසිවකු—

(අ) තමන් අතට පත්ව ඇති ඒ නොතාරිස් ඉදිරිපිට ලියා අත්සන් කරන ලද හෝ පිළිගන්නා ලද යම් ඔප්පුවල කෙටුම්පත්, සටහන්, හෝ පිටපත් කිසිවක් හෝ ඒ නොතාරිස්ගේ ධූරයේ බලය ප්‍රකාර ඔහු සන්තකයෙහි පැවති යම් උපදෙස් පොතක්, ලේඛන පොතක්, සූචියක්, ඔප්පුවක් හෝ කවර ආකාරයේ වූ හෝ යම් ලේඛනයක් ඕනෑකමින් ම නැති කරතහොත් හෝ ඒ කිසිවකට හානි කරතහොත් හෝ එය විනාශ කරතහොත් හෝ ඒ නොතාරිස් පදිංචිව සිටි දිස්ත්‍රික්කයේ ඉඩම් කොමසාරිස්ට හැකි පහසු ඉක්මණින් එය භාරදීම යුක්තිසහගත හා නීත්‍යානුකූල හේතුවක් නොමැතිව ඕනෑකමින් ම පැහැර හරිතහොත් හෝ ප්‍රතික්ෂේප කරතහොත් ; හෝ

(ආ) තමන් අතට පත්ව ඇති ඒනොතාරිස්ගේ නිල මුද්‍රාව මකා ආපසු එවීම සඳහා දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාරදීම ඕනෑකමින් ම පැහැර හරිතහොත් හෝ ප්‍රතික්ෂේප කරතහොත් :

එවැනි සෑම තැනැත්තකු වරදකට වරදකරු වියයුතු අතර ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට බරපතල වැඩ නැති ව හෝ ඇති ව ලිත් මාස දෙළහකට නො වැඩි යම් කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් දෙසියයකට නොවැඩි දඩයකට හෝ ඒ දෙකට ම ඔහු යටත් විය යුතු ය.

(2) නොතාරිස්වරු දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැනුම් දෙන ලද හවුලක් වශයෙන් නොතාරිස් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නා වූ හා එහි එක් හවුල්කරුවකු මිය ගියා වූ හෝ ව්‍යාපාරයෙන් ඉවත්ව ගියා වූ අවස්ථාවක, ඒ ව්‍යාපාරය තවදුරටත් පැවැත්වෙන කාලය ඇතුළත නියුක්ත හවුල්කරු විසින් (1) උපවගන්තියේ (අ) ඡේදයෙහි නිශ්චිත ව සඳහන් ලේඛන තමා වෙත තබා ගත හැකි ය. එහෙත් ඒ ලේඛනවල නාමාවලියක්, නියුක්ත හවුල්කරු විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් සැපයිය යුතු අතර ඒ හවුල්කරු ඒවායෙහි ආරක්ෂක භාරය හා රෙජිස්ට්‍රාර් ජනරාල්ට ඒවා භාරදීම පිළිබඳව වග කිව යුතු ය.

(3) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වූ නොතාරිස් කෙනෙකු විසින් තමාගේ කටයුතුවල කාර්යයන් සඳහා නොතාරිස් කෙනෙකු ද වන සහායක

යකු සේවයෙහි නියුක්ත කරවා ගෙන සිටින්නා වූ ද ඒ නීතිඥ—නොතාරිස්ගේ කටයුතුවල කාර්‍යයන් සඳහා ඒ සහායකයා නොතාරිස් කෙනෙකු වශයෙන් එවැනි සේවා නියුක්තියක් යටතේ වෘත්තියෙහි යෙදෙන්නා වූ ද ඒ සේවා නියුක්තියේ කොන්දේසි පාර්ශ්වකරුවන් විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැනුම් දී ඇත්නා වූ ද අවස්ථාවක, ඒ සහායකයා මිය ගිය විට හෝ ප්‍රධානයාගේ සේවය හැර ගිය විට, 1 වන උපවගන්තියේ (අ) ඡේදයෙහි නිශ්චිත ව සඳහන් ලේඛන තබා ගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් එකී ප්‍රධානයාට (සේවා නියුක්තියෙහි කොන්දේසිවලට යටත් ව) බලය දිය හැකි අතර එකල්හි ඒ සියලු ලේඛන ඒ ප්‍රධානයා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ හෝ ඔහුගේ ධූරයෙහි බලය ප්‍රකාර ඔහු සන්තකයේ පවතින ලේඛන ලෙස මේ ආඥපනතෙහි කාර්‍යයන් සඳහා සැලකිය යුතු ය. එහෙත් එකී ලේඛනවල නාමාවලියක් ප්‍රධානයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත සැපයිය යුතුවත් හැර ඒවායෙහි ආරක්ෂක භාරය හා ඒවා රෙජිස්ට්‍රාර් ජනරාල්ට භාරදීම පිළිබඳ ඔහු වගකිව යුතු ය.

(4) යම් නොතාරිස් කෙනෙකු විසින්, ඔහුට වෘත්තියෙහි යෙදීමට බලය පවරා ඇති ප්‍රදේශයේ ම ස්ථානයක කටයුතු කරගෙන ගිය වෙනත් නොතාරිස් කෙනෙකුගේ ව්‍යාපාරයෙහි කීර්ති නාමය මිලට ගෙන තිබෙන බවට ද ඉන් පසු ඒවෙනත් නොතාරිස් මිය ගිය බවට හෝ ඔහුගේ බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම නොවන අන් හේතුවකින් ඔහු නොතාරිස් ධූරයෙහි ක්‍රියා කිරීම අවසාන කර තිබෙන බවට රෙජිස්ට්‍රාර් ජනරාල් සෑහීමට පත් වූ අවස්ථාවක (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි නිශ්චිත ව සඳහන් (අන්තිම කැමති පත්‍ර හෝ ඌණ පූරණ පත්‍ර, හෝ ඒවායේ කෙටුම්පත්, සටහන් හෝ පිටපත් නොවන) ලේඛන එකී ව්‍යාපාරයෙහි කීර්ති නාමය මිලට ගත් නොතාරිස්ට පැවරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මිය ගිය නොතාරිස්ගේ උරුමකරුවන්ට, පොල්මෑකරුවන්ට හෝ අද්මිනිස්ත්‍රාසි කරුවන්ට හෝ එසේ ක්‍රියා කිරීම අවසාන කරන නොතාරිස්ට බලය දිය හැකි ය ; නැතහොත්, ඒ ලේඛන ඒ වන විට රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත භාර දී ඇතහොත්, ඔහු විසින් ඒ ලේඛන ඉහත කී පරිදි පැවරිය හැකි ය. එවිට ඒ ලේඛන කීර්ති නාමය මිලට ගත් නොතාරිස් ඉදිරිපිට ලියා අත්සන් කළ හෝ පිළිගත් හෝ ඔහුගේ ධූරයේ බලය ප්‍රකාර ඔහු සන්තකයේ පවතින ලේඛන ලෙස මේ ආඥපනතෙහි සියලු කාර්‍යයන් සඳහා සැලකිය යුතු ය. එහෙත් එකී ලේඛනවල නාමාවලියක් ඒ නොතාරිස් විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත සැපයිය යුතුවත් හැර ඒවායේ ආරක්ෂක භාරය හා ඒවා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත භාරදීම පිළිබඳ ව ඔහු වගකිව යුතු ය.

(5) මේ වගන්තියෙහි (3) හා (4) වන උපවගන්තිවල විධිවිධාන—

(අ) සහායකයාගේ සේවා නියුක්තියේ කොන්දේසි රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දන්වා නැතත් එය නොතකා, 1917 ඔක්තෝබර් මස 27 වන දිනයට පෙරාතුව වූ අවුරුදු පහ ඇතුළත සහායක යකු මිය ගිය හෝ ප්‍රධානයාගේ සේවය හැර ගොස් ඇති යම් අවස්ථාවකට ; හෝ

(ආ) යම් නොතාරිස් කෙනකු මිය ගියා වූ හෝ සිය බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම නොවන අන් හේතුවකින් නොතාරිස් ධූරයෙහි ක්‍රියා කිරීම ඉහත කී කාලය ඇතුළත ඔහු විසින් අවසාන කරන ලද්ද වූ යම් අවස්ථාවකට

අදාළ කිරීම රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ව්‍යාප්ත කිරීම නීත්‍යානුකූල විය යුතු ය :

එසේ වුව ද සම්බන්ධිත සියලු තැනැත්තන් විසින් එවැනි ක්‍රියා මාර්ගයකට අනුමතිය දී තිබෙන බවට රෙජිස්ට්‍රාර් ජනරාල් සෑහීමට පත් විය යුතු ය.

ඉදිරිපත් කරනු ලබන අනුපිටපත් ඔප්පුවල නාමාවලි යක් නොතාරිස් විසින් රෙජිස්ට්‍රාර් වෙත භාර දිය යුතු බව.

42. මේ ආඥාපනතෙහි 31 වන වගන්තියේ යම් රීතියක් යටතේ යම් නොතාරිස් කෙනෙකු විසින් යම් ඔප්පුවක අනුපිටපත රෙජිස්ට්‍රාර් වෙත යවනු ලබන කවර අවස්ථාවක වුවත්, නොහොත් යම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වෙත 41 වන වගන්තිය යටතේ යම් ලේඛනයක් භාර දෙනු ලබන කවර අවස්ථාවක වුවත් ඒ නොතාරිස් විසින් හෝ එය යවන හෝ භාරදෙන අන් තැනැත්තා විසින් ඒවායෙහි නාමලේඛන දෙකක් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු අතර රෙජිස්ට්‍රාර් විසින්, එකී ලේඛනවල නිරවද්‍යතාවය නිශ්චය කර ගැනීමෙන් පසු ඒවා අත්සන් කොට ඉන් එකක් ඒ නොතාරිස් හෝ අන් පාර්ශ්වය වෙත ආපසු යවා ඉතිරි නාමාවලිය ගොනු කොට එය ද එහි සඳහන් ලේඛන ද තම කාර්යාලයෙහි වෙනත් ලේඛන මිටි සමග ආරක්ෂා සහිත කර සුරක්ෂිතව තබාගත යුතුය.

(§8, 1943 අංක 7)

එසේ වුව ද ඉහත අන්තිමට දැක්වුණු වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත බාර දෙනු ලැබූ අන්තිම කැමති පත්‍රයක හෝ ඌණ පූර්ණ පත්‍රයක කෙටුම් පතක් හෝ පිටපතක් නොවන යම් ලේඛනයක්, ඒ ලේඛනයේ අනුපිටපත තම කාර්යාලයෙහි ලේඛන මිටි සමග සුරක්ෂිතව තිබෙන බවට යථා පරිදි කරනු ලැබූ පරීක්ෂණයකින් පසු තමා සෑහීමට පත් වුවහොත් තමාට ඒ ලේඛනය භාර දෙනු ලැබූ දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ගතවීමෙන් පසු කවර වේලාවක වුවත් රෙජිස්ට්‍රාර් විසින් විනාශ කරනු ලැබිය හැකිය.

## පළමුවන උපලේඛනය

"අ"

(7 වන වගන්තිය)

### 7 වන වගන්තිය යටතේ ප්‍රතිඥාත ආධුනිකයින් ඇතුළත් කර ගැනීම සඳහා නියෝග

1. නොතාරිස් කෙනෙකුගේ ධූරයට සුදුසුකම් ලබා ගැනීමේ අභිප්‍රායයෙන් ප්‍රතිඥාත ආධුනිකයකු වීමට අදහස් කරන සෑම තැනැත්තෙකුට ම තරඟ පරීක්ෂණයකට පෙනී සිටින ලෙස නියම කළ යුතුය. එවැනි සෑම පරීක්ෂණයකදීම—

(අ) පරීක්ෂණය පවත්වන දිනයේ දී නොතාරිස්වරුන්ගේ ලිපිකරුවන් ලෙස සේවයෙහි නියුක්ත ව සිටින, හා

(ආ) පරීක්ෂණයේ දිනයට පෙරාතුව ම අවුරුදු පහකට නොඅඩු අඛණ්ඩ කාලසීමාවක් එසේ සේවයෙහි නියුක්තව සිටි

තැනැත්තන් සඳහා නිශ්චිත පුරප්පාඩු ගණනක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් වෙන් කර තැබිය හැකිය.

2. 1 වන නියෝගයෙහි සඳහන් පරීක්ෂණයට පෙනී සිටීමට ඉදිරිපත් වන සෑම අපේක්ෂකයකුගේම ඉල්ලීමක්—

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවිය යුතුය ;

(ආ) දෙවන උපලේඛනයෙහි දක්වෙන "අ" ආකෘතියට සාරානුකූල විය යුතුය ;

(ඇ) චරිත සහතික අඩුගනනේ දෙකක්වත් සමග විය යුතු අතර ඉන් එකක් මාස තුනකට වඩා පරණ නොවිය යුතුය ;

(ඈ) අපේක්ෂකයාගේ උපත් සහතිකය හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්ට පිළිගත හැකි අන්දමේ වයස තහවුරු කිරීමේ වෙනත් තත්‍ය සාක්ෂියක් සමග විය යුතුය; තව ද

(ඉ) නොතාරිස් කෙනෙකුගේ ලිපිකරුවකු සම්බන්ධයෙන් වූ විට 1 වන නියෝගය යටතේ තම සුදුසුකම සහතික කිරීම පිණිස තමා සේවයෙහි නියුක්තව සිටින හෝ සිටි නොතාරිස්ගෙන් හෝ නොතාරිස්වරුන්ගෙන් ලත් සහතිකයක් හෝ සහතික සමග විය යුතුය.

3. සෑම ඉල්ලීමක් ම අපේක්ෂකයා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් හා ඔහුගේ ම අත්අකුරින් විය යුතුය.

4. පරීක්ෂණය ආරම්භ වන දිනයේ දී වයස අවුරුදු දහඅටට එළඹ සිටියාහොත් මිස කිසිම තැනැත්තකුට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර නොදිය යුතුය.

5. විභාග කොමසාරිස් විසින් පරීක්ෂණය පැවැත්විය යුතු අතර පරීක්ෂණයේ ප්‍රතිඵල කුසලතා අනුපිළිවෙලට දක්වමින් ඔහු විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත වාර්තාවක් යැවිය යුතුය.

6. (1) විභාග කොමසාරිස්ගෙන් 5 වන නියෝගයෙහි සඳහන් වාර්තාව ලැබුණු විට එම වාර්තාවෙහි නම් සඳහන් අපේක්ෂකයන් අතුරෙන් අවශ්‍ය යැයි තමාට සලකන අපේක්ෂකයන් ගණනකගේ චරිතය, හොඳ නම හා යෝග්‍යතාව පිළිබඳ ව රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් විමසීම් කළ යුතුය.

(2) පරීක්ෂණයේ ප්‍රතිඵල ද (1) ඡේදය යටතේ කරන ලද විමසීම්වලින් ලත් තොරතුරු ද යථා පරිදි සලකා බැලීමෙන් පසු ප්‍රතිඥාත ආධුනිකයන් වශයෙන් අවශ්‍ය අපේක්ෂකයන් ගණන රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තෝරා ඒ එක් එක් අපේක්ෂකයාට ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වෙත ප්‍රතිඥාත ආධුනිකයකු වීමට බලපත්‍රයක් දිය යුතුය.

7. බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ සෑම අපේක්ෂකයකු ම විසින් ඒ බලපත්‍රය නිකුත් කළ දිනයේ සිට මාස හයක් ඇතුළත :—

(අ) බලපත්‍රයේ නම් සඳහන් නීතිඥයා සමග ගිවිසුම් ප්‍රතිඥාවලට ඇතුළත් විය යුතුය ; එසේ ම

(ආ) ඒ ගිවිසුම් ප්‍රතිඥාවල පිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවිය යුතුය .

8. රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් බලපත්‍රයක් ලබා ඇතහොත් මිස කිසිම තැනැත්තකු ප්‍රතිඥාත ආධුනිකයකු නොවිය යුතු ය.

9. සෑම ප්‍රතිඥාත ආධුනිකයකු ම අවුරුදු තුනකට නොඅඩු කාලයක් තම ගිවිසුම් ප්‍රතිඥා අනුව සේවය කළ යුතු අතර ඒ කාලය තුළ නීතිය හා නොතාරිස් කෙනෙකුට අයත් කටයුතු හැදෑරීම හැර අන් කිසිදු රක්ෂාවක් කිරීම හෝ එහි නියුක්තවීම ඔහු විසින් නොකළ යුතු ය.

10. ප්‍රතිඥාත ආධුනිකයා සේවය කරන නීතිඥ ඒ ආධුනිකයා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් වෘත්තියෙහි යෙදෙන නොතාරිස් කෙනකු නොවේ නම් ඒ නීතිඥයා වෙත ආධුනිකයකු වශයෙන් අවුරුදු දෙකක් ද තමා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් වෘත්තියෙහි යෙදෙන නොතාරිස් කෙනකුගේ කාර්යාලයෙහි ආධුනිකයකු වශයෙන් ඉන් පසු අවුරුද්දක් ද ඔහු සේවය කළ යුතු අතර, එසේ කිරීමට සිදු වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් අලුත් බලපත්‍රයක් ලබා ගෙන ඒ බලපත්‍රයෙහි නම් සඳහන් නොතාරිස් සමග අලුත් ගිවිසුම් ප්‍රතිඥාවලට ඇතුළත් විය යුතු ය. ඒ ගිවිසුම් ප්‍රතිඥාවල පිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවිය යුතු ය.

11. යම් තැනැත්තකු ප්‍රතිඥාත ආධුනිකයකු වශයෙන් බැඳුණු නීතිඥයා මිය ගිය විට හෝ ඒ ප්‍රතිඥාවලට ඇතුළත් වූ කාලයෙහි වෘත්තියෙහි යෙදෙමින් සිටි දිස්ත්‍රික්කයෙහි වෘත්තියෙහි යෙදීම ඔහු නතර කළ විට හෝ වෙනත් පිළිගත හැකි හා ප්‍රමාණවත් හේතුවක් පිට ඒ ප්‍රතිඥාත ආධුනිකයාට අන් කිසි නීතිඥයකු වෙත ඔහුගේ ගිවිසුම් ප්‍රතිඥා හරවා ගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අවසර දිය හැකි ය. එවැනි අවස්ථාවක දී, ඒ හරවා ගැනීම ගැන නො තකා මුල් ගිවිසුම් ප්‍රතිඥා යටතේ ඔහු සේවය කර තිබිය හැකි කාලය, ඔහුගේ ආධුනිකත්ව කාලසීමාවේ කොටසක් ලෙස සැලකිය යුතු ය.

12. 9 වන හා 10 වන නියෝග යටතේ වූ සේවයට සාක්ෂ්‍ය වශයෙන් එක් එක් වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දින, ජූනි මස තිස් වන දින, සැප්තැම්බර් මස තිස් වන දින හා දෙසැම්බර් මස තිස් එක් වන දින හෝ ඒ

දිනට පෙර තමා සේවය කරන නීතිඥගෙන් හෝ නොතාරිස්ගෙන් ලබාගත්, මේ ආඥාපනතේ දෙවන උපලේඛනයෙහි දක්වෙන " ආ " ආකෘතියෙහි වූ සහතිකයක් ප්‍රතිඥාත ආධුනිකයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

13. 12 වන නියෝගයෙහි සඳහන් සහතිකය සැපයීමට අපොහොසත් වන යම් ප්‍රතිඥාත ආධුනිකයකු විසින් ඒ අපොහොසත් වීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් සෑහීමට පත් වන පරිදි කරුණු දක්වන ලද නම් මිස එසේ ඔහු අපොහොසත්ව සිටි කාලය ඔහුගේ ආධුනිකත්ව කාලසීමාවේ කොටසක් ලෙස ගණන් ගැනීමට ඔහුට ඉඩ නොදිය යුතුය.

14. මේ නියෝගවල කාර්‍යයන් සඳහා " නොතාරිස්ගේ ලිපිකරු " යන යෙදුමෙන් නොතාරිස් කෙනකු විසින් ඔහුගේ වෘත්තීය කටයුතුවල කාර්‍යයන් සඳහා සේවයෙහි යොදවා ගත් ලිපිකරුවෙක් අදහස් වේ.

" ආ "

(7 වන වගන්තිය)

## 7 වන වගන්තිය යටතේ නොතාරිස්වරුන් ඇතුළත් කර ගැනීම සඳහා නියෝග

1. සිය ගිවිසුම් ප්‍රතිඥා අනුව සේවය කර ඇත්තා වූ ද නොතාරිස් කෙනකු වශයෙන් සුදුසුකම් ලැබීමට අදහස් කරන්නා වූ ද සෑම ප්‍රතිඥාත ආධුනිකයකුට නොතාරිස්වරුන් සඳහා වූ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට නියම කරනු ලැබිය යුතු ය. ඒ සඳහා ඔහු විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතු ය. ඒ ඉල්ලීම මේ ආඥාපනතේ දෙවන උපලේඛනයෙහි " අ2 " ආකෘතියට සාරානුකූල විය යුතු අතර එම ආකෘතියේ 9 වන ඡේදයෙහි සඳහන් ලේඛනවලින් තහවුරු විය යුතු ය.

2. 1 වන නියෝගයෙහි සඳහන් ඉල්ලීම කිරීමට අදහස් කරන සෑම ප්‍රතිඥාත ආධුනිකයකු විසින් ඒ ඉල්ලීම කිරීමට තමා අදහස් කරන බවට ඉංග්‍රීසියෙන් ද තමා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් ද වූ දැන්වීමක් තමා පදිංචි ව සිටින අධිකරණ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් උසාවියේ යම් ප්‍රකට කොටසක අලවනු ලැබීමට ද යටත් පිරිසෙයින් එක් වරක් හෝ ගැසට් පත්‍රයෙහි හා තමා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාවෙන් පළ කෙරෙන දේශීය ප්‍රවෘත්ති පත්‍රයක ප්‍රසිද්ධ කරනු ලැබීමට ද සැලැස්විය යුතු ය. රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉල්ලුම් කිරීමට අඩු ගණනේ මසකට වත් පෙර ඒ දැන්වීම ප්‍රසිද්ධ කළ යුතු ය.

3. තම ප්‍රතිඥා අනුව සේවය කිරීම සම්පූර්ණ කළ දිනයෙන් අවුරුදු දෙකක් ගත වීමෙන් පසු කිසිම ප්‍රතිඥාත ආධුනිකයකු 1 වන නියෝගයෙහි සඳහන් පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසු නො විය යුතු ය :

එසේ වුව ද ඇමතිවරයා විසින් යම් විශේෂ අවස්ථාවක දී මේ නියෝගය ක්‍රියාත්මක වීමේ බලපෑමෙන් ප්‍රතිඥාත ආධුනිකයකු නිදහස් කළ හැකි ය.

4. 1 වන නියෝගයෙහි සඳහන් ඉල්ලීම රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලැබුණු විට එය නිසි පිළිවෙලට තිබේ නම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් එම නියෝගයෙහි සඳහන් පරීක්ෂණය පැවැත්වීමේ කාර්‍ය්‍යය සඳහා එය නීති අධ්‍යාපන සභාව වෙත යැවිය යුතු ය. නීති අධ්‍යාපන සභාව විසින් පරීක්ෂණය පවත්වා පරීක්ෂණයේ ප්‍රතිඵල දක්වෙන වාර්තාවක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවිය යුතු ය.

5. 4 වන නියෝගයෙහි සඳහන් වාර්තාව තමා වෙත ලැබුණු විට, අපේක්ෂකයා යථා පරිදි සුදුසුකම් ලබා ඇති බව තමා සලකනහොත්, ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු වශයෙන් පත් කරනු ලැබීමට අපේක්ෂකයා සුදුසු බවට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඇමතිවරයා වෙත නිර්දේශයක් කළ යුතුය.

දෙවන උපලේඛනය

"අ 1" ආකෘතිය

(පළමුවන උපලේඛනය–"අ",2 වන නියෝගය.)

**ප්‍රතිඥාත ආධුනිකයන් තෝරා ගැනීම සඳහා වූ තරග පරීක්ෂණයට පෙනී සිටීමේ අවසරය සඳහා ඉල්ලීම**

දිනය :————

කොළඹ,
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතටයි.

මහත්මයාණනි,

1. නොතාරිස් ධුරයට සුදුසුකම් ලබා ගැනීමේ අභිප්‍රායයෙන් ප්‍රතිඥාත ආධුනිකයකු වීමට අදහස් කර සිටින මම ප්‍රතිඥාත ආධුනිකයන් තෝරා ගැනීම සඳහා ———— වන දින පවත්වනු ලබන තරග පරීක්ෂණයට ඇතුළත් කර ගනු ලැබීම පිණිස මෙයින් ඉල්ලුම් කර සිටිමි.

2. මගේ සම්පූර්ණ නම ———————— යනුයි.

3. මා පදිංචිව සිටින්නේ ———— දිස්ත්‍රික්කයේ ———— යන ස්ථානයේ ය.

4. පරීක්ෂණය ආරම්භ කෙරෙන දිනයේ දී මගේ වයස අවුරුදු 18 ට අඩු නො වන්නේය. මගේ උපත් සහතිකය (නැතහොත්, වයස ඔප්පු කිරීමේ තත්‍ය සාක්ෂ්‍ය වන ————) (අ) අකුරින් ලකුණු කොට මෙයට අමුණා ඇත.

5. ශ්‍රෙෂ්ඨාධිකරණයේ නීතිඥ ———— මහතා යටතේ ප්‍රතිඥාත ආධුනිකයකු ලෙස සේවය කිරීමට මම අදහස් කර සිටිමි.

6. මා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන දිස්ත්‍රික්කය හා භාෂාව පිළිවෙලින් ———— (දිස්ත්‍රික්කය) හා ———— (භාෂාව) වේ.

7. (අ) ———— පදිංචි ———— විසින් හා ———— පදිංචි ———— විසින් මගේ චරිතය හා යෝග්‍යතාවය පිළිබඳව දෙන ලද සහතික දෙකක මුල් පිටපත් (ආ) සහ (ඇ) අකුරුවලින් ලකුණු කොට මෙයට අමුණා ඇත.

*(ආ) නොතාරිස් කෙනකු යටතේ නොතාරිස් ලිපිකරුවකු වශයෙන් කරන ලද මගේ අවුරුදු පහක අඛණ්ඩ සේවය ඔප්පු කරනු පිණිස නොතාරිස්/නොතාරිස්වරු ———— ගෙන් ලත් සහතිකයක්/සහතික ද මම මෙයට අමුණා එවමි.

8. ප්‍රතිඥාත ආධුනිකයන් තෝරා ගැනීම සඳහා වූ තරග පරීක්ෂණයට පෙනී සිටීමට මට අවසර දෙන මෙන් ඉල්ලා සිටිමි.

ඉල්ලුම්කරුගේ අත්සන :————

තැපැල් ලිපිනය :————

---

* අදාළ නො වේ නම් කපා හරින්න.

"අ 2" ආකෘතිය

(පළමුවන උපලේඛනය–"ආ"; 1 වන නියෝගය.)

**නොතාරිස්වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමේ අවසරය සඳහාත් ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු වශයෙන් ඇතුළත් කරගනු ලැබීම සඳහාත් ඉල්ලීම**

කොළඹ, දිනය :————

රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතටයි.

මහත්මයාණෙනි,

1. නොතාරිස්වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමේ අවසරය සඳහාත් අවසානයේ දී නොතාරිස් කෙනකු වශයෙන් ඇතුළත් කරගනු ලැබීම පිණිසත් මම මෙයින් ඉල්ලුම් කර සිටිමි.

2. මගේ සම්පූර්ණ නම ———— යනුයි.

3. මා පදිංචිව සිටින්නේ————දිස්ත්‍රික්කයේ————යන ස්ථානයෙහි ය.

4. මම ———— දිස්ත්‍රික්කයෙහි වෘත්තියෙහි යෙදීමට අදහස් කරමි.

5. මම අවුරුදු විසි එකේ පූර්ණ වයසට එළඹ සිටිමි.

6. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ ———— මහතා යටතේ ද ප්‍රසිද්ධ නොතාරිස් ———— මහතා යටතේ ද මම මගේ ගිවිසුම් ප්‍රතිඥා අනුව සේවය කෙළෙමි. ප්‍රතිඥාවලට ඇතුළත් වූ දිනය ———— වන දින ද සේවය සම්පූර්ණ කළ දිනය ———— වන දින ද වේ.

7. මම ———— භාෂාවෙන් ඔප්පු පිළියෙල කිරීමට, ඔප්පුවල සත්‍ය භාවය සහතික කිරීමට හෝ ඔප්පු ලියා සහතික කිරීමට අදහස් කරමි.

8. ම විසින් ඉදිරිපත් කිරීමට අදහස් කරන ඇපය පහත සඳහන් පරිදි වේ.

9. පහත සඳහන් ලියකියවිලි මෙයට අමුණා එවමි :—

(අ) ප්‍රතිඥාත ආධුනිකයකු වීමට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මට දෙන ලද බලපත්‍රය—(අ) අකුරින් ලකුණු කොට ඇත ;

(ආ) 2 වන නියෝගයෙහි සඳහන් දැන්වීම දිස්ත්‍රික් උසාවියේ ප්‍රකට ස්ථානයක අලවා තැබූ බවට සාක්ෂිය—(ආ) අකුරින් ලකුණු කොට ඇත ;

(ඇ) 2 වන නියෝගයෙහි සඳහන් දැන්වීම පළකරනු ලැබූ ගැසට් පත්‍රයෙහි හා දේශීය ප්‍රවෘත්ති පත්‍රයෙහි පිටපතක් හෝ ඒ ගැසට් පත්‍රයෙන් හා ප්‍රවෘත්ති පත්‍රයෙන් උධෘතයක්—(ඇ) අකුරින් ලකුණු කොට ඇත ;

(ඈ) මා ආධුනිකයකු වශයෙන් යොදවනු ලැබූ නීතිඥයාගෙන් හා නොතාරිස්ගෙන් (එවැනි කෙනකු වී නම්), මා යථා පරිදි ප්‍රතිඥා කාලය සේවය කළ බවට ද ඒ නීතිඥයාගේ හා නොතාරිස්ගේ මතය අනුව නොතාරිස් කෙනකු ලෙස පත් කරනු ලැබීමට මා සුදුසු හා නිසි තැනැත්තකු බවට ද ලත් සහතිකයක්—(ඈ) අකුරින් ලකුණු කොට ඇත ; සහ

(ඉ) මගේ උපත් සහතිකය හෝ මා වයස අවුරුදු විසි එකට එළඹ සිටින බව ඔප්පු කිරීමට වයස පිළිබඳ වෙනත් සත්‍ය සාක්ෂියක්—(ඉ) අකුරින් ලකුණු කොට ඇත.

————————,

තැපැල් ලිපිනය :———— ඉල්ලුම්කරුගේ අත්සන.

## " ආ " ආකෘතිය

(12 වන නියෝගය ප්‍රමුවන උපලේඛනය-අ.)

### නීතිඥගේ හෝ නොතාරිස්ගේ සහතිකය

ලංකාද්වීපයේ ශ්‍රෙෂ්ඨාධිකරණයේ නීතිඥයකු (හෝ අවස්ථාවෝචිත පරිදි, ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු) වූ මම මෙයට යා කොට ඇති උපලේඛනයෙහි නම සඳහන් ප්‍රතිඥාත ආධුනිකයා ———— යන දිනෙන් අවසන් වූ ත්‍රෛමාසිකය තුළ ලිපිකරුවකු වශයෙන් හොඳාකාරවත් අවංකවත් මට සේවය කළ බව ද ඒ ලිපිකරු වශයෙන් වූ සිය යුතුකම් ඔහු අනලස්ව ඉටු කළ බව ද නොතාරිස් වෘත්තිය සඳහා තම අධ්‍යයන කටයුතු නොකඩව කළ බව ද සහතික කරමි.

————————,
අත්සන.

දිනය ————.

### උක්ත උපලේඛනය

| ප්‍රතිඥාත ආධුනිකයාගේ නම | ලිපිනය | ප්‍රතිඥාවලට ඇතුළත් වූ දිනය | ආධුනිකයා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන දිස්ත්‍රික්කය | ආධුනිකයා වෘත්තියෙහි යෙදීමට අදහස් කරන භාෂාව |
|---|---|---|---|---|
| | | | | |

## " ඇ " ආකෘතිය

(12 (1) වන වගන්තිය).

### දිස්ත්‍රික් විනිශ්චයකරු ඉදිරිපිට කළ යුතු ප්‍රකාශනය

ඒ. බී. වන මම සත්‍යවාදී ව හා විශ්වාසවන්ත ලෙස ද මගේ හැකි ඉහළම ශක්ති ප්‍රමාණයෙන් ද ඇමතිවරයාගේ ———— ක් වූ ———— මස———— වන දින දරන බලපත්‍රයෙන් මට දෙන ලද බලයට එකඟව හා අනුකූල ව නොතාරිස් කෙනකුගේ ධුරයෙහි කටයුතු කරන බව අවංක ලෙස පොරොන්දු වී ප්‍රකාශ කරමි.

" ඈ " ආකෘතිය

## දිස්ත්‍රික් උසාවියේ ලේකම්ගේ සහතිකය

(27 වන වගන්තිය).

———, දිස්ත්‍රික් උසාවියේ ලේකම් ඒ. බී. වන මම නොතාරිස් ආඥා පනතේ නියමිත ලියවිල්ලෙන් වූ ප්‍රකාශනය ——— ස්ථානයෙහි සී. ඩී. විසින් අත්සන් කොට අද දින ම වෙත භාර දී තැන්පත් කොට ගිය බව මෙයින් සහතික කරමි. තව ද එකී සී. ඩී. නොතාරිස් කෙනකු ලෙස යථා පරිදි ලේඛනාරූඪ කරන ලද බව හා ——— භාෂාවෙන් ——— දිස්ත්‍රික්කයේ ——— (මෙහි ප්‍රදේශය සඳහන් කරනු) තුළ එසේ වෘත්තියෙහි යෙදීමට ඔහුට බලය පවරන ලද බව ද මෙයින් වැඩි දුරටත් සහතික කරමි.

එයට සාක්ෂි වශයෙන් ——— වන දින වූ මෙදින මෙම මුද්දර ගසන ලද සහතිකයට මම මගේ අත්සන තැබුවෙමි.

(අත්සන් කළේ) ඒ.බී. ලේකම්

" ඉ " ආකෘතිය

## ලියා සහතික කිරීමේ ආකෘතිය

(31(21) වන වගන්තිය.)

ප්‍රසිද්ධ නොතාරිස් ඒ.බී. වන මම, මේ ඔප්පුවට සාක්ෂි දරන සාක්ෂිකරුවන් වූ දෙදෙනාම මා හඳුනන ——— (සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචි ස්ථාන සඳහන් කරනු ; සාක්ෂිකරුවකුගේ නම අත්සනට වෙනස් නම් ඉහත කී පරිදි ඒ නමින් සහ අත්සනෙහි දෙන ලද නමින් ද ඔහු විස්තර කළ යුතු ය.) ඉදිරිපිට, මේ ඔප්පුවෙහි ජුවානිස් යනුවෙන් (හෝ, අවස්ථාවෝචිත පරිදි, ලකුණකින්) අත්සන් තැබුවා වූ ද (තමා හඳුනන්නේ නම්) මා හඳුනන්නා වූ ද එකී වාහලතන්ත්‍රිගේ ජුවානිස් ප්‍රනාන්දු විසින් ඉහත දක්වුණු නීත්‍යානුකූල ලේඛනය කියවා බැලීමෙන් (හෝ එකී නොතාරිස් වන මා විසින් ඔහුට කියවා තේරුම් කර දීමෙන්) පසු එකී වාහලතන්ත්‍රිගේ ජුවානිස් ප්‍රනාන්දු විසින් හා එකී සාක්ෂිකරුවන් විසින් මා ඉදිරිපිට දී හා ඔවුනොවුන් ඉදිරිපිට දී එක ම වේලාවේ සියලු දෙනාම පැමිණ සිටිය දී ——— ක් වූ ——— වන දින ——— දී එයට අත්සන් තබන ලද බව මෙයින් ලියා සහතික කරමි.

තවද, එකී නොතාරිස් වූ මා විසින් එකී වාහලතන්ත්‍රිගේ ජුවානිස් ප්‍රනාන්දුට ඉහත දක්වුණු නීත්‍යානුකූල ලේඛනය කියවා දීමට පෙර ——— වන පිටුවේ ——— වන පේළියෙහි " ———" යන වචනය හෝ අකුර මකා හැරි බව ද ——— වන පිටුවේ ——— වන පේළියෙහි "———" යන වචනය හෝ අකුර "———" යන වචනයට හෝ අකුරට වෙනස් කළ බව ද ——— වන පිටුවේ ——— වන පේළියෙහි "———" යන වචනය හෝ අකුර අතර ලියන ලද බව ද වැඩිදුරටත් ලියා සහතික කරන අතර ——— වන පිටුවේ ——— ගේ අත්සනෙහි "———" යන අකුර ඔහු විසින් මකා හරින ලද බව ද ——— වන පිටුවේ ඔප්පුවේ අනුක්‍රමික අංකයෙහි "———" යන ඉලක්කම "———" යන්නට

වගන්

ම විසින් වෙනස් කරන ලද බව ද ———— වන පිටුවේ ———— වටිනාකමින් යුක්ත වූ හා විකුණුම්කරුගේ අංකය දරන මුද්දරය මත "————" යන දිනය "————" යන්නට ම විසින් වෙනස් කරන ලද බව ද මා ඉදිරිපිට දී ප්‍රතිෂ්ඨාව (හෝ, ප්‍රතිෂ්ඨාවෙහි කොටසක්) වූ රු. ———— ගෙවූ (හෝ, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතිෂ්ඨාවක් නොගෙවූ) බව ද මේ නීත්‍යානුකූල ලේඛන යෙහි මුල් පිටපතට රු. ———— ක් වටිනා මුද්දර ———— ගැසූ බව ද අනුපිටපතට රු. ———— ක් වටිනා මුද්දර ———— ගැසූ බව ද එසේ ම ලියා සහතික කරමි.

————————.

ප්‍රසිද්ධ නොතාරිස්.

මුද්‍රාව :

ලියා සහතික කිරීමේ දිනය :————.

"ඊ" කොටස

ඔප්පු පිළිබඳ ලේඛන පොත හා මාස්පතා නාමාවලිය

(31 (24), (26) හා (29)වන වගන්ති).

| 1 | 2 | 3 | 4 පාර්ශ්වකරුවන්ගේ නම |  | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| අංකය | දිනය | නීත්‍යානුකූල ලේඛනයේ ස්වභාවය | දීමනාකරු | ලැබුම්කරු | ලියාපදිංචි කළ දිස්ත්‍රික්කය | ඔප්පුව බලපාන ඉඩමේ, ඉඩම් කොටසේ හෝ ඇතහොත් ඉඩම් වන ඉඩමේ පමණක් නම | ප්‍රතිෂ්ඨාව | අනුපිටපතේ මුද්දර |
|  |  |  |  |  |  |  |  |  |

"උ" ආකෘති පත්‍රය

සතිපතා නාමාවලිය

(31 (27) වන වගන්තිය).

| (1) ලියා අත්සන් කරන ලද දිනය සහ ස්ථානය | (2) ඔප්පුවේ අංකය | (3) ඔප්පුවේ ස්වභාවය | (4) පාර්ශ්වකරුවන්ගේ නම |
|---|---|---|---|
|  |  |  |  |

# තුන්වන උපලේඛනය

## නොතාරිස්වරුන්ගේ ගාස්තු වක්‍රය

(40 වන වගන්තිය)

1. වටිනාකම හෝ ප්‍රතිෂ්ඨාව සඳහන් වූ චංචල හෝ නිශ්චල දේපළ පවරා දීමේ යම් ඔප්පුවක් හා සාමාන්‍ය ක්‍රමයේ උකස්කරයක් හෝ බැඳුම්කරයක්, හෝ විශේෂ පොරොන්දු නැත්තා වූ ද බදු මුදල හෝ ප්‍රතිෂ්ඨාව සඳහන් වූ ද සාමාන්‍ය ක්‍රමයේ යම් බදුකරයක් පිළියෙල කිරීම, නීත්‍යානුකූලව සකස් කිරීම, සහ ලියා සහතික කිරීම සඳහා :

එම වටිනාකම හෝ ප්‍රතිෂ්ඨාව (බදුකරයක නම් මුළු කාලයට ම අයත් බදු මුදල)—

| | | රු. | ශ. |
|---|---|---|---|
| රුපියල් 75 ට වැඩි නොවේ නම් | ... ... ... | 1 | 0 |
| රුපියල් 75 ට වැඩිව රු. 200 ට වැඩි නොවේ නම් | ... ... | 2 | 0 |
| රුපියල් 200 ට වැඩිව රු. 350 ට වැඩි නොවේ නම් | ... ... | 3 | 0 |
| රුපියල් 350 ට වැඩිව රු. 500 ට වැඩි නොවේ නම් | ... | 3 | 75 |
| රුපියල් 500 ට වැඩිව රු. 750 ට වැඩි නොවේ නම් | ... ... | 4 | 50 |
| රුපියල් 750 ට වැඩිව රු. 1,000 ට වැඩි නොවේ නම් | ... ... | 5 | 25 |
| රුපියල් 1,000 ට වැඩිව රු. 1,500 ට වැඩි නොවේ නම් | ... ... | 6 | 75 |
| රුපියල් 1,500 ට වැඩිව රු. 2,000 ට වැඩි නොවේ නම් | ... ... | 8 | 25 |
| රුපියල් 2,000 ට වැඩිව රු. 3,000 ට වැඩි නොවේ නම් | ... ... | 9 | 75 |
| රුපියල් 3,000 ට වැඩිව රු. 4,000 ට වැඩි නොවේ නම් | ... ... | 12 | 0 |
| රුපියල් 4,000 ට වැඩිව රු. 5,000 ට වැඩි නොවේ නම් | ... ... | 13 | 50 |
| රුපියල් 5,000 ට වැඩිව රු. 10,000 ට වැඩි නොවේ නම් | ... ... | 15 | 0 |

රුපියල් 10,000 ඊට ඉහළට ප්‍රතිෂ්ඨාවේ සෑම රු. 1,000 කට ශත 50 ක අතිරේක මුදලක්

එසේ වුව ද, බදු කාලය අවුරුදු පහකට වැඩි වන අවස්ථාවක දී සාමාන්‍ය ක්‍රමයේ බදුකරයකට ගෙවිය යුතු ගාස්තුව අවුරුදු පහක කාලයක බදුකරයකට ගෙවිය යුතු ගාස්තුවට වැඩි නො විය යුතු ය.

2. සාමාන්‍ය ක්‍රමයේ නොවූ, නොයෙක් පොරොන්දු, විස්තර ප්‍රකාශ හෝ කොන්දේසි ඇතුළත් වන, නොහොත් ඉඩම් කැබලි කීපයක විස්තර ඇතුළත් වන, ප්‍රතිෂ්ඨාව එහි දක්වා ඇති හෝ නැති පැවරුම්කරයක්, උකස්කරයක් හෝ බදුකරයක් හෝ යම් බැඳුම්කරයක්, සහ අන්තිම කැමති පත්‍ර සහ වෙනත් බූදල් බෙදීම් ඇතුළු සියලු ගිවිසුම්, ඔප්පු, ඇටෝර්නි බලපත්‍ර හෝ වෙනත් නීත්‍යානුකූල ලේඛන පිළියෙල කිරීම නීත්‍යානුකූලව සකස් කිරීම සහ ලියා සහතික කිරීම කිරීම සඳහා : එවැනි සෑම ලේඛනයකට, වචන 120 ක පත් ඉරුවක් සඳහා ... 3 50

ලියා සහතික කිරීම සඳහා ඔප්පුව වෙනත් නොතාරිස් කෙනකු වෙත යවනු ලබන අවස්ථාවල දී පිළියෙල කිරීමට හා නීත්‍යානුකූල ව සකස් කිරීමට ඉහත සඳහන් ගාස්තුව වලංගු විය යුතු ය.

3. ලියා සහතික කරන නොතාරිස් විසින් ම පිළියෙල නො කරන ලද යම් ඔප්පුවක් හෝ නීත්‍යානුකූල ලේඛනයක් අනුපිටපතකින් යුක්තව ලියා සහතික කිරීමට එම ඔප්පුව පිළියෙල කිරීම සඳහා වූ ගාස්තුවෙන් අඩකට සමාන මුදලක් එහෙත් අඩුම ගාස්තුව රු. 1.50 ක් ද වැඩිම ගාස්තුව රු. 10.50 ක් ද විය යුතු ය.

| | රු. | ශ. |
|---|---|---|
| 4. විකිණීමට, අන්තිම කැමති පත්‍රයකින් පැවරීමට හෝ උකස් කිරීමට ඇති යම් දේපළක අයිතිය යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට පරීක්ෂා කිරීමට, එක ඔප්පුවක් පමණක් ඇතහොත් ... ... | 2 | 50 |
| ඔප්පු එකකට වඩා ඇතහොත් එක් එක් වැඩිපුර ඔප්පුවට ... | 1 | 0 |
| 5. යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට අයිතිය පිළිබඳ ලඝු උධෘතයක් පිළියෙල කිරීමට, උධෘතය ගත් එක් එක් ඔප්පුව වෙනුවෙන් ... ... | 1 | 0 |
| 6. යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි යම් ඔප්පුවක් ලියා පදිංචි කිරීම සඳහා එම ඔප්පුව පිළියෙල කිරීමට, නීත්‍යානුකූලව සකස් කිරීමට හා ලියා සහතික කිරීමට අවසර දෙන ලද ගාස්තුවලින් අඩකි. | | |
| එසේ වුව ද වැඩිම ගාස්තුව රු. 5.00 කට වැඩි නො විය යුතු ය. | | |
| 7. හුවමාරු බිල් පත්‍රයක් හෝ පොරොන්දු පත්‍රයක් සටහන් කිරීමට, ලියා පදිංචි කිරීමේ පොතෙහි හෝ විරෝධතා පොතෙහි එය පිටපත් කිරීම ද එය ඉදිරිපත් කිරීම ද ඇතුළුව ... ... ... | 1 | 25 |
| එයට විරෝධතා ප්‍රකාශ කිරීමට ... ... ... | 7 | 50 |
| එබඳු විරෝධතා ප්‍රකාශයක එක් එක් අනුපිටපතකට ... ... | 2 | 50 |
| 8. විරෝධයෙන් පසු කරන එක් එක් ගෙවීම භාර ගැනීමේ සටහනකට ... | 5 | 0 |
| එබඳු විරෝධතා සටහනක එක් එක් අනුපිටපතකට ... ... | 2 | 50 |
| 9. මුදලකින් කොටසක් ගෙවන බිල් පත්‍රයක සහ ඒ සඳහා වූ ලදුපතක පිට පතකට ... ... ... ... | 1 | 50 |
| 10. නැවක හෝ යාත්‍රාවක විරෝධය සටහන් කිරීමට, එය ලියා පදිංචි කිරීමේ පොතෙහි හෝ විරෝධතා පොතෙහි පිටපත් කිරීම ද ඇතුළුව ... | 7 | 50 |
| 11. නැවක හෝ යාත්‍රාවක විරෝධය පිළියෙල කිරීම, නීත්‍යානුකූලව සකස් කිරීම, ලියා සහතික කිරීම සහ සටහන් කිරීම සඳහා, වචන 120 ක හෝ එයට අඩු ගණනක එක් එක් පත් ඉරුවට ... ... | 3 | 50 |
| 12. පාර්ශ්වකරුවන්ට අවශ්‍ය විට, ඔප්පුවල සෑම නොතාරිස් පිටපතකට හෝ උධෘතයක්ට (ලියා සහතික කිරීමට හැර)— | | |
| වචන 120 ක එක් එක් පත් ඉරුවක් සඳහා ... ... | 0 | 50 |
| එය ලියා සහතික කිරීමේ ගාස්තුව ... ... | 2 | 50 |
| 13. නීත්‍යානුකූලව සකස් කොට, ලියා සහතික කොට ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවනු ලබන සෑම අනුපිටපත් ඔප්පුවක් සඳහා, ඒ ඔප්පුව පිළියෙල කිරීමට, නීත්‍යානුකූලව සකස් කිරීමට සහ ලියා සහතික කිරීමට අවසර දී ඇති ගාස්තුවලින් අඩකි. | | |
| 14. පිටරට යැවීමට අදහස් කර තිබෙන යම් ලේඛනයක් පිළිබඳ ව ආරක්ෂක හා විදේශ කටයුතු ඇමතිවරයාගේ හෝ වෙනත් නිලධරයකුගේ සහතිකයක් පිළියෙල කිරීමට ... ... ... | 2 | 50 |
| 15. කවර කාර්යයක් සඳහා වුව ද අපරභාග 5 සිට පූර්වභාග 9 දක්වා කාලය තුළ නොතාරිස්ගේ කාර්යාලයෙහි දී හෝ අන් ස්ථානයක දී පැමිණ සිටීමට, සෑම පැයකට හෝ පැයකින් කොටසකට ... ... | 2 | 50 |
| 16. යම් එක් ඉඩමක් සම්බන්ධයෙන් බැඳීම් තිබේ දැයි නිශ්චය වශයෙන් දැන ගැනීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්ගේ කාර්යාලයට යෑමට ... | 2 | 50 |
| 17. එම ඔප්පුවෙහි ම එක් එක් අමතර ඉඩමක් සඳහා ... ... | 0 | 50 |
| 18. එම කාර්යය සඳහා ඉල්ලීමක් ලිවීමට ... ... | 0 | 50 |
| 19. නොතාරිස්ගේ නිවස හෝ කාර්යාලය නො වන වෙනත් ස්ථානයක දී පැමිණ සිටීමට—යාමට හැතැප්මකට හෝ ඊට අඩු දුරකට රුපියල් 1 බැගින් ද, ආපසු ඒමට ශත 50 බැගින් ද ගමන් ගාස්තු වශයෙන් අයකර ගැනීමට අවසර දිය යුතු ය. | | |

# ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 20 දරන නොතාරිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1976 අගෝස්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1976 සැප්තැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 40 යි. තැපැල් ගාස්තුව: ශත 15 යි.

## ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 20 දරන නොතාරිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1976 අගෝස්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 19/74.

**නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 20 දරන නොතාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

2. මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන **නොතාරිස් ආඥාපනතෙහි,—**

*නොතාරිස් ආඥාපනතෙහි අලුත් යෙදුම් ආදේශ කිරීම.*

(අ) පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයකුගේ දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් යොදනු ලබන අවස්ථා වන්හි දී හැර, “දිස්ත්‍රික්කය” යන යෙදුම වෙනුවට “කලාපය” යන යෙදුම ;

(ආ) “දිසා අධිකරණය” යන යෙදුම වෙනුවට “මහාධිකරණය” යන යෙදුම ;

(ඇ) “දිසා විනිශ්චයකාරවරයා” යන යෙදුම වෙනුවට “මහාධිකරණ විනිශ්චයකාරවරයා” යන යෙදුම ;

(ඈ) “කොට්ඨාසය” යන යෙදුම වෙනුවට “කලාපය” යන යෙදුම ;

(ඉ) “අධිකරණ කොට්ඨාසය” යන යෙදුම වෙනුවට “අධිකරණ කලාපය” යන යෙදුම ;

(ඊ) “අධිකරණ දිස්ත්‍රික්කය” යන යෙදුම වෙනුවට “අධිකරණ කලාපය” යන යෙදුම ;

(උ) “නීතිඥයකු” යන යෙදුම වෙනුවට “නීතිඥවරයකු” යන යෙදුම, “නීතිඥයා” යන යෙදුම වෙනුවට “නීතිඥවරයා” යන යෙදුම් සහ “නීතිඥයන්” යන යෙදුම වෙනුවට “නීතිඥවරයන්” යන යෙදුම ; සහ

(ඌ) “ලේකම්” යන යෙදුම වෙනුවට “රෙජිස්ට්‍රාර්වරයා” යන යෙදුම

ආදේශ කරනු ලැබිය යුතු ය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයන් නොතාරිස්වරයන් වශයෙන් ඇතුළත් කර ගනු ලැබීමට සුදුසු බව*

3. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් ඇතුළත් කර ගනු ලැබීමට පෙර වුව ද පසුව වුව ද ඔප්පු ලිවීම පිළිබඳ නියමිත පරීක්ෂණයෙන් සමත් වී සිටින්නා වූ සෑම නීතිඥවරයෙක් හෝ එක්සත් රාජධානියෙහි හෝ අන් රටක නීතිය පිළිබඳව ලබාගන්නා ලද්ද වූ හා ඔප්පු ලිවීම පිළිබඳ සාමාර්ථයක් අවශ්‍ය වන්නා වූ නෛතික සුදුසුකමක බලය ප්‍රකාර පරීක්ෂණයක් නොමැතිව ඇතුළත් කරගනු

ලැබ සිටින්නා වූ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ සෑම නීතිඥවරයෙක් ම, ඔහු ඉල්ලුම් කළ විට, තමා පදිංචිව සිටින අධිකරණ කලාපය තුළ, ඔප්පු ලිවීම පිළිබඳ පරීක්ෂණයෙන් තමා සමත්වී සිටින භාෂාවෙන් නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට බලය දෙන බලපත්‍රයක් ලැබීමට හිමිකම් ලබන්නේ ය. ”.

4අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

4. පහත සඳහන් අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම ප්‍රඥප්තියෙහි 4අ වන වගන්තිය වශයෙන් එය බලපවත්වන්නේ ය :—

“ අධිකරණ කොට්ඨාසයෙහි වෘත්තියෙහි යෙදෙන නොතාරිස්වරයන් අධිකරණ කලාපයෙහි වෘත්තියෙහි යෙදෙන්නන් වශයෙන් සැලකිය යුතු බව.

4අ. තමා පදිංචිව සිටින යම් අධිකරණ කොට්ඨාසයක් තුළ නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට බලය දෙමින් 3 වන වගන්තියේ හෝ 4 වන වගන්තියේ විධිවිධාන යටතේ නොතාරිස්වරයකුට නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයකින් ම, තමා පදිංචිව සිටින අධිකරණ කලාපය තුළ නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට තමාට බලය දෙනු ලබන ලෙස සැලකිය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“ නොතාරිස්වරයකුට වෘත්තියෙහි යෙදීමට බලය දී ඇති කලාපය වෙනස් කිරීමට අමාත්‍යවරයාගේ බලය.

11. අධිකරණ කලාපයක් තුළ වෘත්තියෙහි යෙදීමට තමාට බලය දෙන බලපත්‍රයක් ඇති නොතාරිස්වරයකු විසින් වෙනත් අධිකරණ කලාපයක් තුළ වෘත්තියෙහි යෙදීමට තමාට බලය දෙන අලුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලැබූ විට අමාත්‍යවරයා විසින් එවැනි අලුත් බලපත්‍රයක් ඔහුට ප්‍රදානය කරනු ලැබිය හැකි ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“ නොතාරිස්වරයන්ගේ නාමාවලිය අධිකරණවල ප්‍රදර්ශනය කළ යුතු බව.

18. (1) යම් කලාපයක් ඇතුළත නොතාරිස්වරයන් වශයෙන් ක්‍රියා කිරීමට බලය දෙනු ලැබූ සියලු ම තැනැත්තන්ගේ නාමාවලියක් මහජනයාගේ දැනගැනීම පිණිස කලාපයේ මහාධිකරණයෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක සියලු කාල වේලාවල ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

(2) මියගොස් ඇත්තා වූ හෝ නොතාරිස්වරයන්ගේ නාමලේඛනයෙන් නම කපා හැර ඇත්තා වූ හෝ එකී කලාපය අත්හැර ගොස් ඇත්තා වූ හෝ නොතාරිස්වරයන් වශයෙන් ඒ

කලාපය තුළ වෘත්තියෙහි යෙදීම නතර කර ඇත්තා වූ නොතාරිස්වරයන්ගේ නම් ඉවත් කිරීමෙන් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අවශ්‍ය විය හැකි පරිදි කලින් කල එකී නාමාවලිය නිවැරදි කළ යුතු ය.

(3) එක් එක් වර්ෂයේ ජූනි මස තිස් වන දින හා දෙසැම්බර් මස තිස් එක් වන දින, එදින තෙක් නිවැරදි කරන ලද ඒ නාමාවලියේ පිටපතක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද, කලාපය තුළ ඒ ඒ දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණයේ බලසීමා ඇතුළත වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති නොතාරිස්වරයන්ගේ නිවැරදි කළ නාමාවලියක් ඒ කලාපය තුළ පිහිටි පිළිවෙලින් ඒ එක් එක් දිසා අධිකරණය හා මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ද රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉදිරිපත් කළ යුතු ය.

(4) එක් එක් දිසා විනිශ්චයකාරවරයා සහ මහෙස්ත්‍රාත්වරයා විසින් එසේ තමා වෙත ලැබුණු නාමාවලිය තම අධිකරණයෙහි බිත්තිය මත ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීමට සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නොතාරිස් ධුරයෙහි කාර්ය ඉටු කිරීම අත්හිටුවීම.

19. (1) දිසා අධිකරණයක් හෝ මහාධිකරණයක් ඉදිරිපිට නොතාරිස්වරයකුට විරුද්ධව අධිචෝදනා නගා ඇති අවස්ථාවක නීතිපතිවරයාගේ ඉල්ලීම පිට අමාත්‍යවරයා විසින්, ඔහුගේ නඩු විභාගය පැවැත්වෙන තුරු, ඔහු නොතාරිස් ධුරයෙහි කාර්ය ඉටු කිරීමෙන් අත්හිටුවිය හැකි ය. ඒ නොතාරිස්වරයා නිදහස් කරනු ලැබුවහොත් හෝ ධුරයෙහි කාර්ය ඉටුකිරීම අත්හිටුවනු ලැබීමෙන් පසු මාස හයක් ඇතුළත නඩු විභාගයට ඉදිරිපත් කරනු නොලැබුවහොත් ඒ අත්හිටුවීම අවලංගු විය යුතු අතර එය ඉවත් කරනු ලැබූ ලෙස ද සැලකිය යුතු ය.

(2) නීතිඥවරයකු වූ නොතාරිස්වරයකු ඔහුගේ නීතිඥ ධුරයෙහි කාර්ය ඉටු කිරීමෙන් අත්හිටුවනු ලැබූ අවස්ථාවක ඒ අත්හිටුවීම බලපවත්නා කාලය තුළ නොතාරිස්වරයකුගේ කාර්ය ඉටු කිරීමට ඔහු සුදුස්සෙක් නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" බලපත්‍රය අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ සහතිකය ප්‍රදේශයේ අධිකරණ වලට යැවිය යුතු බව සහ ඒ අධිකරණවල ප්‍රදර්ශනය කර තැබිය යුතු බව.

Supreme
H. C.
High Courts
District Courts
Magistrate Court

23. (1) නොතාරිස්වරයකුගේ බලපත්‍රය අවලංගු කරන ලද හෝ නොතාරිස්වරයකු ඔහුගේ ධුරයෙහි කාර්ය ඉටු කිරීමෙන් අත්හිටුවනු ලැබූ හෝ කවර අවස්ථාවක වුව ද ඒ පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, ඒ බලපත්‍රය අවලංගු කර ඇති බවට හෝ ඒ නොතාරිස්වරයා ඔහුගේ ධුරයෙහි කාර්ය ඉටු කිරීමෙන් අත්හිටුවනු ලැබූ බවට සහතිකයක් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද ඒ නොතාරිස්වරයාට ක්‍රියා කිරීමට බලය දී තිබුණේ යම් අධිකරණ බලසීමා තුළ ද එහි මහාධිකරණ විනිශ්චයකාර වරයා වෙත ද විවිධ දිසා විනිශ්චයකාරවරයන් හා මහෙස්ත්‍රාත්වරයන් වෙත ද අමාත්‍යාංශයේ ලේකම් විසින් යැවිය යුතු ය.

(2) ඒ නොතාරිස්වරයාගේ නම ලේඛනගත කර ඇත්තේ යම් මහාධිකරණයක ද ඒ මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් එම නොතාරිස් වරයාගේ බලපත්‍රය අවලංගු කළ අවස්ථාවක දී, නොතාරිස්වරයන්ගේ නාමලේඛනයෙන් ඔහුගේ නම වහා ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර නොතාරිස්වරයා ඔහුගේ ධුරයෙහි කාර්ය ඉටු කිරීමෙන් අත්හිටුවනු ලැබූ අවස්ථාවක දී නාම ලේඛනයෙහි ඔහුගේ නම ඉදිරියෙන් ඒ කරුණ සටහන් කළ යුතු ය.

(3) ඒ සහතිකයේ පිටපතක්, එයට අමුණන ලද එහි දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනයකුත් සමග ඒ සෑම මහාධිකරණයක, දිසා අධිකරණයක සහ මහෙස්ත්‍රාත් අධිකරණයක ප්‍රකටව පෙනෙන ස්ථානයක, අධිකරණය විසින් විධාන කළ හැකි කාලයක් ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" නිශ්ප්‍රභ කිරීමේ දැන්වීම.

(2) ඒ ආඥාව පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එහි පිටපතක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අලුත් බලපත්‍රයෙහි සඳහන් ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන මහාධිකරණ විනිශ්චයකාර වරයා වෙත ද, එකී ප්‍රදේශය විෂයෙහි අධිකරණ

බලය දරන විවිධ දිසා විනිශ්චයකාරවරයන් හා මහෙස්ත්‍රාත්වරයන් වෙත හා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද අමාත්‍යාංශයේ ලේකම් විසින් යැවිය යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (29) වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් රීතිය ආදේශ කිරීමෙන් :—

"නොතාරිස් වරයා පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටි ඉඩම්වලට බලපාන ඔප්පු ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම.

(29) අන්තිම කැමති පත්‍රයක් හෝ ලංකා පූරණ පත්‍රයක් හෝ නොවන ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් යම් නොතාරිස්වරයකු ඉදිරිපිට අත්සන් කරනු ලැබ ඔහු විසින් ලියා සහතික කරන ලද්දේ ද, ඒ නොතාරිස්වරයා පදිංචි දිස්ත්‍රික්කය නොවන දිස්ත්‍රික්කයක පිහිටි ඉඩමක් කෙරෙහි එය බලපාන්නේ නම්, ඒ නොතාරිස්වරයා විසින් නැතහොත් ඒ ඔප්පුව හෝ සාධන පත්‍රය නොතාරිස්වරයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් ලියා සහතික කරන ලද අවස්ථාවක ඒ ඔප්පුවෙහි සාධන පත්‍රයෙහි අනුපිටපත ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා වෙත යැවීමේ යුතුකම පැවරී ඇති නොතාරිස්වරයා විසින්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කළ මාසයට පසුව එළඹෙන මාසයේ පසළොස් වන දිනයෙහි හෝ එදිනට පෙර, ඒ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ තමා විසින් නිවැරදි බවට සහතික කරන ලද පිටපතක්, ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම්වලට අදාළ සියලුම ඔප්පු හෝ සාධන පත්‍රවල තමා විසින් අත්සන් කරන ලද්ද වූ හා දෙවන උපලේඛනයේ "ඊ" ආකෘතියෙහි වූ ද අනුපිටපතක් සහිත වූ ද නාමාවලියකුත් සමග (ඉහත කී පරිදි අනුපිටපත යැවීමට අමතරව) ඒ අන්තිමට සඳහන් කළ දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙන ගොස් භාර දිය යුතුය; නැතහොත් යැවිය යුතුය.";

සහ

(2) එහි (30) වන රීතියේ (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"ලේඛන මිළ නොතාරිස් වරයාගේ කාර්යාලයෙහි තබා ගත යුතු බව.

(ආ) තම කාර්යාලයෙහි හෝ තමාට කාර්යාල එකකට වැඩි ගණනක් ඇතහොත් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමත කරනු ලබන කාර්යාලයක හෝ ඔහු විසින් තම ලේඛන මිටි තබා ගත යුතු අතර රෙජිස්ට්‍රාර් ජන

රාල්ට ද, පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති වරයාට ද, තමා පදිංචි කලාපයෙහි මහාධිකරණ විනිශ්චයකාරවරයාට ද, දිසා විනිශ්චයකාරවරයාට හෝ මහේස්ත්‍රාත්වරයාට ද යුක්ති සහගත සියලු කාලවේලාවල එම කාර්යාලයෙහි දී ඒ ලේඛන මිටි පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියෙහි (2) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) නොතාරිස්වරයන් විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු පිළිබඳ වූ නූන්වන උපලේඛනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් වූ නිවැරදි පිටපතක් සෑම මහාධිකරණයක, දිසා අධිකරණයක, මහේස්ත්‍රාත් අධිකරණයක, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයක හා කච්චේරියක ද සෑම නොතාරිස්වරයකු විසින් ඔහුගේ එක් එක් කාර්යාලයෙහි ද ප්‍රකටව පෙනෙන ස්ථානයක සියලු කාලවේලාවල ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වූ නොතාරිස්වරයකු විසින් තමාගේ කටයුතුවල කාර්යයන් සඳහා නොතාරිස්වරයකු වන සහායකයකු සේවයෙහි යොදවා ගෙන සිටින්නා වූ ද, නීතිඥවරයකු වූ එකී නොතාරිස්වරයාගේ කටයුතුවල කාර්යයන් සඳහා ඒ සහායකයා නොතාරිස්වරයකු වශයෙන් එවැනි සේවයේ යෙදවීමක් යටතේ වෘත්තියෙහි යෙදෙන්නා වූ ද ඒ සේවයෙහි යෙදවීමේ කොන්දේසි පාර්ශ්වකරුවන් විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත දැනුම් දී ඇත්තා වූ ද අවස්ථාවක, ඒ සහායකයා මිය ගිය විට හෝ තම ප්‍රධානයාගේ සේවය හැර ගිය විට, (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් ලේඛන තබා ගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් එකී ප්‍රධානයාට (ඒ සේවයෙහි යෙදවීමේ කොන්දේසිවලට යටත්ව) බලය පැවරිය හැකි අතර එකල්හි ඒ සියලු ලේඛන ඒ ප්‍රධානයා ඉදිරිපිට ලියා අත්සන් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ හෝ ඔහුගේ ධුරයෙහි බලය ප්‍රකාර ඔහු සන්තකයේ පවත්නා වූ හෝ ලේඛන ලෙස මේ ආඥාපනතෙහි කාර්යයන් සඳහා සැලකිය යුතු ය. එහෙත් එකී ලේඛනවල නාමාවලියක් එම ප්‍රධානයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත සැපැයිය යුතු අතර ඒවායෙහි ආරක්ෂක භාරය හා ඒවා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ගෙන ගොස් භාරදීම පිළිබඳව ඔහු වගකිව යුතු ය.".

මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලබන සංශෝධන අතීතයට ද බලපාන බව.

**13.** මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලබන සංශෝධන සියලු කාර්යයන් සඳහා 1974 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.